# 2022.04.08 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
04. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
14.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා

**<u>රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්</u>**

01. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
02. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා

08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2022 අප්‍රේල් මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

## I.2022.03.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.03.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත් , එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022.03.08 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022.03.08 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>සංශෝධන 01</u>**

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022.03.08 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 16 හි මාගේ ප්‍රකාශය තුල "මේ ඇත් රජිදාට දෙව්ලොව හර්ෂවිජය වරම් ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා" යනුවෙන් සඳහන් වනවා.එය "මේ ඇත් රජිදාට දෙව්ලොව දෙවි කෙනෙක් වීමේ වරම් ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා" යනුවෙන් සංශෝධනය විය යුතුයි.

**<u>සංශෝධන 02</u>**

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.03.08 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 02 හි සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන යටතේ මාගේ ප්‍රකාශය තුල " පසුගිය කාලයේ මාස දෙක හමාරකට අධික කාලයක් විශාල ජලය ප්‍රමාණයක් හෙට්ටිපොල ඉඳන් බණ්ඩාරකොස්වත්තට ප්‍රවාහනය කිරීමට සිදු වුණා."යනුවෙන් සඳහන් වනවා.එය " පසුගිය කාලයේ වසර දෙක හමාරකට අධික කාලයක් විශාල ජලය ප්‍රමාණයක් හෙට්ටිපොල ඉඳන් බණ්ඩාරකොස්වත්තට ප්‍රවාහනය කිරීමට සිදු වුණා." යනුවෙන් සංශෝධනය විය යුතුයි.
ඉහත සංශෝධන සභා වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස නිළධාරී මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඒ අනුව ඉහත සංශෝධන වලට යටත්ව 2022.03.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ඉහත සංශෝධන වලට යටත්ව 2022.03.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා විසින් 2022.03.08 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.
2022.04.11 දින පැවැත්වීමට නියමිතව තිබූ මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාව 2022.04.19 දින පැවැත්වෙන බව ගරු මන්ත්‍රී මණ්ඩලයට දන්වා සිටිනවා.
ගරු මන්ත්‍රීවරුණි,අපි විශාල පරිශ්‍රමයක් දරලා අපේ සභාවට බරපතල ප්‍රශ්නයක්ව තිබූ බණ්ඩාරකොස්වත්ත ජල ව්‍යාපෘතියේ ගැටළුව අපි විසඳා තිබෙනවා.පසුගිය කාලයේ හෙට්ටිපොල සිට බණ්ඩාරකොස්වත්තට ජලය බවුසර් වලින් ප්‍රවාහනය කරන්න විශාල වියදමක් දරලා තිබෙනවා.මම සභාපති ධූරයට පත් වන කාලයේ වතුර බවුසර් 15 ක් විතර බණ්ඩාරකොස්වත්තට ප්‍රවාහනය කලා.සේවක වැටුප්,ඉන්ධන ඇතුළු දේවල් වලට විශාල වියදමක් දරලා තිබෙනවා.වර්ෂයකට එක්කෝටි නව ලක්ෂ පනස් තුන් දහසක් විතර දළ වශයෙන් වියදම් වී තිබෙනවා.ඒ නිසා මම සභාපතිධූරය භාරගැනීමෙන් පසුව අත්‍යවශ්‍ය මූලික ප්‍රශ්නවලට ක්ෂණිකවම අපි අවධානය යොමු කරලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තා.මුලින්ම ආ ගැටළුවක් තමයි බණ්ඩාරකොස්වත්ත උප නගරයේ පානීය ජල ප්‍රශ්නය.දීර්ඝ කාලයක් තිස්සේ තිබූ ප්‍රශ්නයක්.අපි අපේ නිලධාරීන් යොදවලා ඒ තිබුණ ජල ව්‍යාපෘතියේ අඩුපාඩු සොයා බලා අළුත්වැඩියා කලා.නමුත් සාර්ථක නෑ.ඒ නිසා අපි මේකට ඇස්තමේන්තු සකස් කරලා වෙනම ළිඳක් ඉදි කරලා ජල සම්පත් මණ්ඩලය,පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් අනුමැතිය ලබාගෙන අපි ළිඳ ඉදි කිරීම් කටයුතු කලා. ඉදි කිරීම් කටයුතු ආරම්භ වුණේ පෙබරවාරි මාසේ.මාර්තු 31 වන විට අපි ඉදිකිරීම් සම්පූර්ණයෙන් අවසන් කර ජනතා අයිතියට පත් කලා.බණ්ඩාරකොස්වත්තේ පානීය ජල ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳලා දුන්නා.මේ සඳහා වැය වුණේ ලක්ෂ 40 කටත් වඩා අඩු මුදලක්.ප්‍රාදේශීය සභා අරමුදලෙන් තමයි මේ සම්පූර්ණ මුදල යෙදවූවේ.සමහර අය මේක අසාර්ථක ව්‍යාපෘතියක් කීවා.මේ ඉඩම අපිට අයිති නෑ කීවා.අවශ්‍ය සියලුම අංශ වලින් අනුමැතිය අරගෙන මේ ළිඳ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කලා.මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ දී අපේ පක්ෂ විපක්ෂ සහෝදර මන්ත්‍රීතුමන්ලා,විශේෂයෙන්ම කොට්ඨාසයේ ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා, ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය, ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා වගකීමෙන් කටයුතු කලා.ඉදිකිරීම් කටයුතු කල ඉංදික මහතා මිල ගණන් එක්ක දරන්න බැරි ව්‍යාපෘතියක් ඉටු කලේ.ඒ වෙනුවෙන් සභාවේ ප්‍රශංසාව එතුමාට පිරිනමනවා.ඒ වගේම අපිට තව විශාල වශයෙන් උදව් කල කෙනෙක් තමයි උපුල් මහතා.උපුල් මහතාගේ ඉඩම හරහා තමයි නල එළීම් හා විදුලිය ලබා ගැනීම කරන්න සිදු වුණේ.එසේ නොකලා නම් මීට වඩා විශාල මුදලක් වැය වෙනවා.ඒ වෙනුවෙන් උපුල් මහතාටත් අපි ස්තූතිවන්ත වෙනවා.අතිගරු ජනාධිපතිතුමා ගේ බෞද්ධ කටයුතු උපදේශක කොළඹගම ගල්ලැහැපිටිය පේමරතන හිමිපාණන් වහන්සේට,පල්ලේගම විහාරාධිපති ස්වාමීන් වහන්සේට,ගරු මන්ත්‍රී මණ්ඩලයට,ප්‍රදේශවාසීන්ට,කාර්මික නිලධාරී මහතුන්ට,අපේ නිලධාරී මණ්ඩලයට,සේවක මහතුන්ට,කම්කරු මහතුන්ට හා මේ සඳහා දායකත්වය ලබා දුන් සියලුම දෙනාට ස්තූතිය පිරිනමනවා.ඉතාම වටිනා වැඩක් කලා කියලා අද අපට සතුටු වෙන්න පුළුවන්.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

අති දැවැන්ත මුදලක් වැය කරලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් බණ්ඩාරකොස්වත්තේ දීර්ඝ කාලීනව තිබූ ජල ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් ළිඳක් ඉදි කර ජනතා අයිතියට පත් කිරීම සම්බන්ධයෙන් ඔබතුමා අදහස් ඉදිරිපත් කලා.කොට්ඨාසයේ මහ ජනතාව වෙනුවෙන් ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා.මේ සඳහා කටයුතු කල සියලු දෙනාට ස්තූති කිරීම සම්බන්ධව.ගරු සභාපතිතුමණි,ඔබතුමා බලයට පත් වීමෙන් පසු අති දැවැන්ත වැඩ කොටසක් මේ උප නගරයට සිදු කලා.මිනිසාගේ මූලික අවශ්‍යතාවක් වන ජලය ලබා දීමට ඔබතුමා කටයුතු කලා.වසර දෙක හමාරක් විතර හෙට්ටිපොල සිට බණ්ඩාරකොස්වත්තට අති විශාල වශයෙන් ජල බවුසර් යෙදීමට ඔබතුමා කටයුතු කලා.ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාට කොට්ඨාසයේ මහජනතාව වෙනුවෙන් ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම ලේකම්තුමා ප්‍රමුඛ කාර්යය මණ්ඩලයත් මේ සම්බන්ධව උපරිම දදායකත්වයක් ලබා දුන්නා.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සමස්ත කාර්යය මණ්ඩලයටත් මගේ ස්තූතිය පුද කරනවා.ඒ වගේම ගරු සභාපතිතුමා ඒ මුදල වෙන් කරලා අවශ්‍ය කටයුතු සම්පාදනය කලා.ඒ වගේම සභාවේ තාක්ෂණ නිලධාරීන් ඒ ඇස්තමේන්තු සකස් කරලා අවශ්‍ය කටයුතු සිදු කලා.ඒ ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දුන් මුදල් කමිටුවේ සියලු ගරු මන්ත්‍රීවරුන්ට ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම මෙය කරගෙන යන විට බාධක ආවා.ඒ සියලු දේට මුහුණ දීලා ගැටලු විසඳාගෙන පසුගිය මාසේ 31 වන දින මේ ළිඳ ජනතා අයිතියට පත් කලා,සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට ඇනුම් දීලා.ඒ සඳහා ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සහභාගී වුනා.ඒ සියලු දෙනාටමත් ස්තූතිවන්ත වෙනවා.ඒ ප්‍රදේශයේ සියලු ජනතාවට එය භුක්ති විඳීමට අවස්ථාව සලසා දුන්නා.අති දැවැන්ත ගැටළුවකට ඔබතුමා විසඳුමක් ලබා දීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතාට ස්තුතිවන්ත වෙනවා.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන.

## I.නිවාඩු අනුමත කිරීම.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා වෙත නිවාඩු අනුමත කර න මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදී සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)

එම යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදී රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## II.කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## III.වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය පඩුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය පඩුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය පඩුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය පඩුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය පඩුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## IV.සේවක ණය සම්බන්ධයෙන් දීර්ඝ කාලයක සිට පවතින ගැටළුව නිරාකරණය කර ගැනීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සේවක ණය සම්බන්ධයෙන් දීර්ඝ කාලයක සිට පවතින ගැටළුව නිරාකරණය කර ගැනීම සම්බන්ධව සාධාරණීකරණ වාර්තාවක් සැකසීම සඳහා පත් කල කමිටුව විසින්

ඉදිරිපත් කර ඇති සාධාරණීකරණ වාර්තාව අනුව,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිටි සේවක මහත්ම මහත්මීන් විසින් ලබාගෙන තිබූ සේවක ණය වාරික වසර ගණනාවක සිට හිඟව පැවතීම හේතුවෙන් සේවක ණය ගිණුමේ දිගු කාලීනව අය නොවන හිඟ ණය ලෙස රු:156080.28 ක ශේෂයක් ඇති බව දක්වා තිබෙනවා.එම රු:156080.28 ක් වූ ණය ශේෂ අතරින්, එච්.ජී.සත්‍යකාන්ති මිය විශ්‍රාම ගොස් ඇති අතර විශ්‍රාම පාරිතෝෂික මුදලින් ණය පියවීම සඳහා අප වෙත එවා ඇත්තේ රු:4401.00 ක් අඩුවෙන් බැවින්,එම හිඟ ණය ශේෂය එච්.ජී.සත්‍යකාන්ති මියගෙන් අය කිරීමත්,දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට හැකියාවක් නොමැති රු:151679.28ක් වූ හිඟ ණය ශේෂ විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත් සඳහා යෝජනා ස්ථිර කර ගන්නා මෙන් ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

ගරු සභාපතිතුමණි,මේ අයගේ ණය මුදල් කපා හැරීමට අනුමැතිය ඉල්ලන්නේ එම ණය මුදල් අය කර ගැනීමට කිසිම ක්‍රමවේදයක් නැති නිසාද?

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ගරු උප සභාපතිතුමණි,දීර්ඝ කාලයක් තිබූ හිඟ ණය ශේෂයක් තමයි මේ ඉදිරියට ඇවිත් තිබෙන්නේ.හැකි තරම් ඒ අය දැනුවත් කරලා ණය මුදල් අය කරගෙන තිබෙනවා.මේ ඉතිරි වී තිබෙන ණය මුදල් වල සමහර අය මිය ගිහින්.ඒ අයගේ තොරතුරු සොයා ගත නොහැකි වීමේ ගැටළුවක් ඇති වී තිබෙනවා.මේ වගේ විවිධ හේතු නිසයි මේ ණය අය කර ගන්න බැරි.ඒ නිසයි මේ ගැටළු නිරාකරණය කර ගැනීමට මෙම යෝජනාව මහා සභාවට ඉදිරිපත් කලේ.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සේවක ණය ගිණුමේ දිගු කාලීනව අය නොවන හිඟ ණය ලෙස පවතින රු:156080.28 ක් වූ ණය ශේෂ අතරින්, එච්.ජී.සත්‍යකාන්ති මිය විශ්‍රාම ගොස් ඇති අතර විශ්‍රාම පාරිතෝෂික මුදලින් ණය පියවීම සඳහා අප වෙත එවා ඇත්තේ රු:4401.00 ක් අඩුවෙන් බැවින්,එම හිඟ ණය ශේෂය එච්.ජී.සත්‍යකාන්ති මියගෙන් අය කිරීමට පියවර ගැනීමත් ,දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට හැකියාවක් නොමැති ඉතිරි රු:151679.28 ක් වූ හිඟ ණය ශේෂ විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සේවක ණය ගිණුමේ දිගු කාලීනව අය නොවන හිඟ ණය ලෙස පවතින රු:156080.28 ක් වූ ණය ශේෂ අතරින්, එච්.ජී.සත්‍යකාන්ති මිය විශ්‍රාම ගොස් ඇති අතර විශ්‍රාම පාරිතෝෂික මුදලින් ණය පියවීම සඳහා අප වෙත එවා ඇත්තේ රු:4401.00 ක් අඩුවෙන් බැවින්,එම හිඟ ණය ශේෂය එච්.ජී.සත්‍යකාන්ති මියගෙන් අය කිරීමට පියවර ගැනීමත්,දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට හැකියාවක් නොමැති ඉතිරි රු:151679.28 ක් වූ හිඟ ණය ශේෂ විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සේවක ණය ගිණුමේ දිගු කාලීනව අය නොවන හිඟ ණය ලෙස පවතින රු:156080.28 ක් වූ ණය ශේෂ අතරින්, එච්.ජී.සත්‍යකාන්ති මිය විශ්‍රාම ගොස් ඇති අතර විශ්‍රාම පාරිතෝෂික මුදලින් ණය පියවීම සඳහා අප වෙත එවා ඇත්තේ රු:4401.00 ක් අඩුවෙන් බැවින්,එම හිඟ ණය ශේෂය එච්.ජී.සත්‍යකාන්ති මියගෙන් අය කිරීමට පියවර ගැනීමත්,දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට හැකියාවක් නොමැති ඉතිරි රු:151679.28 ක් වූ හිඟ ණය ශේෂ විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් මාවී ඇළ සතිපොල ගොඩනැගිල්ල කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්) සමාගම වෙත බදු ලබා දීමට සකස් කල තක්සේරු වාර්තාව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් මාවී ඇළ සතිපොල ගොඩනැගිලි හා භූමි පරිශ්‍රය කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්)

සමාගම වෙත මාසික කුලිය යටතේ ලබා දීමට තක්සේරු කිරීම සඳහා පත් කල කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව අදාල කමිටු වාර්තාවේ සඳහන් පරිදි මාවී ඇළ සතිපොල ගොඩනැගිලි හා භූමි පරිශ්‍රය කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්) සමාගම වෙත වසරක කාලයක් සඳහා මාසිකව රු.25,850.00 ක මාසික කුලියක් යටතේ බදු ලබා දීමටත්,ඉන් අනතුරුව රජයේ තක්සේරුව ලැබෙන්නේ නම් එම තක්සේරු වටිනාකම් මත නැවත බදු ලබා දීමටත් යෝජනා ස්ථිර කර ගන්නා මෙන් ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

ගරු සභාපතිතුමණි,අපි මේකට ඩිපොසිට් එකක් තියාගෙන දෙනවාද?

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු මන්ත්‍රීතුමණි,මේ සඳහා ගිවිසුමක් තිබෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් මාවී ඇළ සතිපොල ගොඩනැගිලි හා භූමි පරිශ්‍රය කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්) සමාගම වෙත මාසික කුලිය යටතේ ලබා දීමට තක්සේරු කිරීම සඳහා පත් කල කමිටු වාර්තාවේ සඳහන් පරිදි මාවී ඇළ සතිපොල ගොඩනැගිලි හා භූමි පරිශ්‍රය කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්) සමාගම වෙත වසරක කාලයක් සඳහා මාසිකව රු.25,850.00 ක මාසික කුලියක් යටතේ බදු ලබා දීමත්,ඉන් අනතුරුව රජයේ තක්සේරුව ලැබෙන්නේ නම් එම තක්සේරු වටිනාකම් මත නැවත බදු ලබා දීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

ගරු සභාපතිතුමණි,බණ්ඩාරකොස්වත්තේ පානීය ජලය ලබා දීම සම්බන්ධව කාරණාවේ දී ඒසඳහා සම්බන්ධ වූ විවිධ අයට ස්තූතියක් ඉදිරිපත් කලා.මගේ මතකයේ හැටියට 2021 වර්ෂයේ අයවැයේ දී හිටපු ගරු සභාපති සුනිල් ජයවීර මැතිතුමා ඒ ළිඳ ඉඳි කරන්න මුදල් වෙන් කලා.ඒ සිදු කල ස්තූතියට හිටපු ගරු සභාපති සුනිල් ජයවීර මැතිතුමා ගේ නමත් ඇතුලත් වුණා නම් හොඳයි.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් මාවී ඇළ සතිපොල ගොඩනැගිලි හා භූමි පරිශ්‍රය කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්) සමාගම වෙත මාසික කුලිය යටතේ ලබා දීමට තක්සේරු කිරීම සඳහා පත් කල කමිටු වාර්තාවේ සඳහන් පරිදි මාවී ඇළ සතිපොල ගොඩනැගිලි හා භූමි පරිශ්‍රය කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්) සමාගම වෙත වසරක කාලයක් සඳහා මාසිකව රු.25,850.00 ක මාසික කුලියක් යටතේ බදු ලබා දීමත්,ඉන් අනතුරුව රජයේ තක්සේරුව ලැබෙන්නේ නම් එම තක්සේරු වටිනාකම් මත නැවත බදු ලබා දීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් මාවී ඇළ සතිපොල ගොඩනැගිලි හා භූමි පරිශ්‍රය කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්) සමාගම වෙත මාසික කුලිය යටතේ ලබා දීමට තක්සේරු කිරීම සඳහා පත් කල කමිටු වාර්තාවේ සඳහන් පරිදි මාවී ඇළ සතිපොල ගොඩනැගිලි හා භූමි පරිශ්‍රය කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන අපනයන සැකසුම් ගම්මාන (EPV) ව්‍යාපෘතිය සඳහා අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් (පෞද්) සමාගම වෙත වසරක කාලයක් සඳහා මාසිකව රු.25,850.00 ක මාසික කුලියක් යටතේ බදු ලබා දීමත්,ඉන් අනතුරුව රජයේ තක්සේරුව ලැබෙන්නේ නම් එම තක්සේරු වටිනාකම් මත නැවත බදු ලබා දීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා

## I.පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් මැනුම් කර ඇති මාර්ග සම්බන්ධව විරෝධතා කැඳවීම ගැසට් කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් ග්‍රාම නිළධාරී වසම් 103 මාර්ග 2157 ක් මේ වන විට මැනුම් කර සභා මාර්ග ලෙස ප්‍රකාශයට පත් කර ගැසට් කල යුතු වෙනවා.එම නිසා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව මැනුම් කටයුතු කර ඇති මාර්ග 2157 ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ගැසට් කිරීමත්,එකී මාර්ග සඳහා විරෝධතා ඇත්නම් ගැසට් කරන දින සිට දින 30 ක් ඇතුලත සභාව වෙත ඉදිරිපත් කිරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.කෝටි 10 ක් විතර යන වැඩක් අපි එච්චර වියදමක් යන්නේ නැතිව කරලා තිබෙනවා.අපේ නිලධාරී මහත්වරු යොදවලා තමයි මේ කාර්යය සිදු කලේ.එකී මාර්ග සඳහා විරෝධතා ඇත්නම් ගැසට් කරන දින සිට දින 30 ක් ඇතුලත සභාව වෙත ඉදිරිපත් කරන්න පුළුවන්.එසේ නැතිනම් මේ මාර්ග නැවත වතාවක් ගැසට් කරනවා.ගැසට් කරලා ප්‍රකාශයට පත් කලාම මේ මාර්ග සම්පූර්ණයෙන්ම ප්‍රාදේශීය සභාවේ අනුමත සිතියම් ගත කල මැනුම් කල මාර්ග ලෙස ලේඛනගත වෙනවා.මේක සමස්ත රටෙන්ම ප්‍රථම වතාවට සිදු කරලා තිබෙන්නේ වයඹ පළාතේයි.මේ මාර්ග ගැසට් කිරීමට සභා අනුමැතියක් අවශ්‍යයි.ඒ නිසා තමයි මෙම කාරණය අද දින මහා සභාවට ඉදිරිපත් කලේ.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමණි,පඬුවස්නුවර ආසනය තුල ග්‍රාම සේවා වසම් 103 සියලුම මාර්ග 2157 කීවා මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුලම තිබෙන්නේ.මේ වන විට එම මාර්ග 2157 න් සභාව සතු මාර්ග විදිහට මාර්ග කීයක් පවරාගෙන තිබෙනවාද?

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු උප සභාපතිතුමා,මේ සියලුම මාර්ග වල මැනුම් කටයුතු සිදු කරලා තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමණි,මේ වන විට සභාවෙන් නඩත්තු කරන මාර්ග ප්‍රමාණයත් ඔය 2157 තුල ඇතුලත් වී තිබෙන්න ඕනනේ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු උප සභාපතිතුමා,බල ප්‍රදේශයේ සභාව සතු සියලුම මාර්ග මෙහි ඇතුලත්.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව මා ස්ථිර කරනවා.ගරු සභාපතිතුමණි,මෙම මාර්ග මැනුම් කටයුතු කර අවශ්‍ය කටයුතු සිදු කල සියලුම නිලධාරී මහත්වරුන්ට සභාවේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.අපේ ගරු මන්ත්‍රීවරුන්ට තමන්ගේ කොට්ඨාසයේ මාර්ග බලා ගැනීමට ඒ මාර්ග සම්බන්ධයෙන් ලේඛනයක් ලබා දීමට කටයුතු කරන ලෙස මම ඉල්ලීමක් කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමණි,දැන් අපි මේක ගැසට් කරනවානේ.ගැසට් කලාට පසු මම සභාවේ මෝටර ග්‍රේඩරය ඉල්ලුවා කියන්නකෝ මාර්ගයක් සංවර්ධනය කරන්න.එම මාර්ගය ගැසට් එකේ තිබුණේ නැතිනම් එම මාර්ගයට සංවර්ධනය කරන්න පුළුවන් වෙනවාද?

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මම හිතන්නේ බල ප්‍රදේශයේ තිබෙන සියලුම මාර්ග මේ ලැයිස්තුවට ඇතලත් වෙලා තිබෙන්නේ.බැරි වෙලාවත් ඇතුලත් නොවුණ මාර්ගයක් තිබෙනවා නම් අපි පනතේ තිබෙන බලතල එක්ක කටයුතු කරමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමණි,එහෙම නම් ගැටළුවක් නෑ.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමණි,මේ ඉදිරිපත් කර තිබෙන මාර්ග 2157 සම්බන්ධව තමයි විරෝධතා ඉදිරිපත් කරන්නේ.මේ ලේඛනයට ඇතුලත් වී නොමැති මාර්ග නැවත මේකට ඇතුලත් කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීවරුණි,මේ සම්බන්ධව අවශ්‍ය තොරතුරු පිළිබඳව වැඩි දුරටත් දැනුවත් වීම සඳහා අපි මේ සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,අපේ සභාව සතු මාර්ග කිලෝ මීටර් දෙදහස් ගණනක් ගැසට් කරලා පවරාගෙන තිබෙනවා මම හිතන ආකාරයට.අවුරුද්දකට පමණ පෙර අපේ නිලධාරීන් ගිහින් අපෙනුත් අදහස් අරන් මේ

මාර්ග මැනුම් කටයුතු කලා.ඒ නිසා මේ ලේඛනයේ 95% ක්ම සභාව සතු මාර්ග කියලා මම විශ්වාස කරනවා.ඊට අමතරව අපි මාර්ගයක් සභාවට පවරා ගන්න කියලා ඉල්ලීම් කරන ක්‍රමවේදයක් තිබෙනවා.එහෙම පවරාගත් මාර්ග මේ සභාවේ තිබෙනවා.මේ මාර්ග ලැයිස්තුවට නව මාර්ග ඇතුලත් වී තිබෙනවාද?ඇතුලත් වී තිබෙනවා නම් ඒ කුමන නිර්ණායක මතද, පදනම මතද ඇතුලත් වුණේ.ඇතුලත් වී නැති මාර්ග තිබෙනවා නම් ඇතුලත් කරන්න අහන්නේ.මේක හොඳ යෝජනාවක්.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**</u>

ගරු සභාපතිතුමණි,මැනුම් කටයුතු සංවර්ධන නිලධාරීන් හරහා කරන්න ඇති.මේ නිළධාරීන්,තාක්ෂණ නිලධාරීන් ගිහින් දකින්නේ යම් ප්‍රමාණයක මාර්ග පමණයි.ඒ නිසා මේක ගැසට් කරන්න පෙර,මේ කොට්ඨාස 22 ම නියෝජනය කරන මන්ත්‍රීවරු ඉන්නවා.අතුරු මාර්ග තිබෙනවා.කලින් එක් නිවසක් තිබුණ මාර්ග වල නිවෙස් කිහිපයක් හැදිලා මාර්ග හැදිලා තිබෙනවා.එතකොට කවුරු හරි ඉදිරියේ දී තීරණයක් ගත්තොත්, අපි කටයුතු කරන්නේ මේ මාර්ග සම්බන්ධව පමණයි කියලා ඒක ගැටළුවක්.ප්‍රධාන මාර්ග වලට අමතරව කෙටි මාර්ග තිබෙනවා.ඒ නිසා මම අදහසක් වශයෙන් ඉදිරිපත් කරනවා. ඒ නිසා මේක ගැසට් කරන්න පෙර මේ කොට්ඨාසවල ඉන්න ග්‍රාම නිළධාරීතුමන්ලාගෙන්,ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගන්න පුළුවන්.ඒ නිසා මේ ගැසට් කිරීම හදිස්සි නොවී ගරු මන්ත්‍රීතුමන්ලා හා අදාල රාජ්‍ය නිලධාරීන් එකතු වී අපි ලැයිස්තුවක් හදලා දෙන්නම්,මේ මාර්ග සියල්ල ඇතුලත් කර දෙන්න කියලා.ඔබතුමා යම් කාල සීමාවක් දුනනොත් අපිට ඒ කාර්යය සම්පූර්ණයෙන්ම කරන්න පුළුවන් වෙයි.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා පෙ.ව.11.21ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

මේ සම්බන්ධව දැනුවත් වීම සඳහා මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

මෙම කාරක සභා අවස්ථාව නැවත මහා සභා අවස්ථාව බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව මැනුම් කටයුතු කර ඇති මාර්ග 2157 ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ගැසට් කිරීමත්,එකී මාර්ග සඳහා විරෝධතා ඇත්නම් ගැසට් කරන දින සිට දින 30 ක් ඇතුලත සභාව වෙත ඉදිරිපත් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව, මැයි මස  මහා සභා වාරයට කල් තැබීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා.**</u>

මේ මාර්ග ලැයිස්තුවේ සඳහන් මාර්ග,තම තමන්ගේ කොට්ඨාස වලට අදාල මාර්ග වෙන වෙනම ඇතුලත් මාර්ග ලැයිස්තු අපි සියලු ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙනවා.සතියක කාලයක් ඇතුලත මේවාගේ අඩුපාඩු තිබෙනවා නම් ඒවා ලිඛිතව තව ලබා දෙන්න.ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව මැනුම් කටයුතු කර ඇති මාර්ග 2157 ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ගැසට් කිරීමත්,එකී මාර්ග සඳහා විරෝධතා ඇත්නම් ගැසට් කරන දින සිට දින 30 ක් ඇතුලත සභාව වෙත ඉදිරිපත් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව, මැයි මස  මහා සභා වාරයට කල් තැබීම සුදුසු බව ගරු සභාවේ  ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව මැනුම් කටයුතු කර ඇති මාර්ග 2157 ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ගැසට් කිරීමත්,එකී මාර්ග සඳහා විරෝධතා ඇත්නම් ගැසට් කරන දින සිට දින 30 ක් ඇතුලත සභාව වෙත ඉදිරිපත් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව, මැයි මස මහා සභා වාරයට කල් තැබීම සුදුසු බව ගරු සභාවේ  ඒකමතිකව සභා සම්මත විය.**

**II.පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017/2018/2019 වර්ෂවල ඉදි කල ව්‍යාපෘති වෙනුවෙන් රඳවා ගත් රැඳවුම් මුදල් ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් දැනුවත් කිරීමත්,එතුමන් මඟින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීමටත් යෝජනා කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017/2018/2019 වර්ෂවල ඉදි කල ව්‍යාපෘති වෙනුවෙන් රඳවා ගත් රැඳවුම් මුදල් ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් දැනුවත් කිරීමත්,එතුමන් මඟින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීමත් සඳහා වූ යෝජනාවක් ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව ඉදිරිපත් කිරීමට එතුමන්ට අවස්ථාව ලබා දෙනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා - (එ.ජා.ප.)</u>

පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017/2018/2019 වර්ෂවල ඉදි කල ව්‍යාපෘති වෙනුවෙන් රඳවා ගත් රැඳවුම් මුදල් ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් දැනුවත් කිරීමත්,එතුමන් මඟින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීමට කටයුතු කිරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.නොයෙක් නොයෙක් අවස්ථාවන්වල රජයන් පත් වෙනවා.ඒ පත්වන රජයන් විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.ග්‍රාමීය මාර්ග,පාලම්,බෝක්කු වගේ හැම දෙයක්ම සෑදීමට වැඩසටහන් ඉදිරිපත් කරනවා. වැඩසටහන් ඉදිරිපත් වුනාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඒ අදාල නිලධාරීන්ගේ මැදිහත් වීම මත මේ ව්‍යාපෘති භාර ගන්න පුද්ගලයන්ට ලොකු බල කිරීමක් කරනවා,ව්‍යාපෘතියක් හැටියට මහජනතාවට දෙන්න ඉක්මන් කරනවා.මේ ව්‍යාපෘති කරගෙන යන අවස්ථාවේ දී මේ සෑම නිලධාරියෙක්ම පෙර විපරම් කරනවා මේ ව්‍යාපෘතිය පිළිබඳව.ව්‍යාපෘතිය කරලා අවසන් වුනාම පසු විපරමක් කෙරෙන්නේ නෑ.පසු විපරමක් නොවීම නිසා මේ ව්‍යාපෘතිය ඉටු කරන අය අපහසුතාවට පත් වී තිබෙනවා.2017,2018,2019,2020 ආදී සියලුම වර්ෂවල රැඳවුම් මුදල්,ගම්පෙරලිය වැඩසටහනේ ව්‍යාපෘති එකසිය අනූ ගණනක් කරලා තිබෙනවා.ඒවායේ ව්‍යාපෘති හතරෙන් එකක වගේ රැඳවුම් මුදල් නිකුත් කරලා තිබෙනවා.තව ව්‍යාපෘති 142 කට රැඳවුම් මුදල් නිකුත් කරන්න තිබෙනවා.මේවාගේ කොන්ත්‍රාත් කරපු සමිතිය හෝ පුද්ගලයා හෝ අවුරුදු ගණනාවක් බලාගෙන ඉන්නවා මේ ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් ලබා ගන්න.පසුගිය වකවානුව දෙස බලපුවාම මේ ව්‍යාපෘති සිදු කිරීම මිනිස්සු අත් හරින තත්ත්වයක් ආවා.පත් වන ඕනෑම රජයක් කෙටි කාලීනව හෝ දිගු කාලීනව සිදු කරගෙන යන වැඩසටහන් එක්ක මේවා ගැන නොසලකා හරිනවා.නැගෙනහිරත් සමහර දේවල් කරලා තිබෙනවා.මෑතක අහලා බලන විට පඩුවස්නුවර බටහිර ගෙවමින් පවතිනවා.2017,2018,2019,2020 වර්ෂවල හා අද දිනය වන තෙක් ගත්තාම එදා ලක්ෂයක් ගන්න තිබුණා නම් ඒ මුදල අද වන විට කොතෙක් දුරට පිරිහිලා තිබෙනවාද?මේ ව්‍යාපෘතිය සිදු කරන පුද්ගලයාට මේකේ වටිනාකමක් නෑ.ඒ නිසා තමයි මම හිතන්නේ ලොකු ව්‍යාපෘති ප්‍රමාණයක් ආපසු යන්නත් හේතු වෙන්න ඇත්තේ.සපිරිගමක් වැඩසටහන 2020 වර්ෂයේ දී මේ රජයෙන් ක්‍රියාත්මක කරලා තිබෙනවා.එහි දී ව්‍යාපෘති 156 ක් කරලා තිබෙනවා.එයින් රැඳවුම් මුදල් වශයෙන් ලක්ෂ 145ක මුදලක් ගෙවන්න තිබෙනවා.මේ ගැන කතා කරන්න අපිට අවස්ථාවක් ලැබෙන්නේත් නෑ.විවිධ ක්‍රමවේද පාවිච්චි කරලා සමහර අය අරන් තිබෙනවා.මේ කාරණය මම සඳහන් කරන්න හිතුවේ අපේ ප්‍රදේශයේ විවිධ සමිති,ස්වේච්ඡා සංවිධාන මේ ව්‍යාපෘති කරලා මුදල් ලැබෙනකම් අවුරුදු ගණනාවක් බලාගෙන ඉන්නවා.ඒ අය වෙනුවෙන් අපි පෙනී සිටින්න ඕන.ඒ නිසයි මේ යෝජනාව මම සභාවට ඉදිරිපත් කරන්න හිතුවේ.ගරු සභාපතිතුමණි,අපි සභාව නියෝජනය කරන පිරිසක් විදිහට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ගිහින් මේ යෝජනාව යෝජනාවක් ලෙස ඉදිරිපත් කරලා කාරණා ඉදිරිපත් කිරීම තමයි මම මේ සභාව හරහා බලාපොරොත්තු වෙන්නේ.ඉදිරියේ දී මේ අවනඩුව කියන්න කෙනෙක් නැද්ද කියලාත් හිතෙනවා.ගරු සභාපතිතුමණි,ඔබතුමා අපිට මේ අවස්ථාව ලබා දෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

මේ යෝජනාව බොහෝම කාලෝචිත යෝජනාවක්.එක එක ආණ්ඩු ආවාම අපිට යෝජනා දීලා මාර්ග හදන්න පුළුවන්.අපි අසමත් රාජ්‍යයක් බවට පත් වෙන්න ප්‍රධානතම හේතුව අපිට ලබා දෙන මුදල් ඇතුළු හැම දේකම අකාර්යක්ෂමතාවය.අපිට ඒ යෝජනා දුන්නාම අසමත් වන ආකාරය මම කියන්නම්.ලක්ෂ 20

ක යෝජනාවක් හදන්න ගත්තාම අපිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් බලපෑම් එනවා ඉක්මනින් හදන්න කියලා.මේකේ සල්ලි කොහේ තිබෙනවාද කවුරුත්ම දන්නේ නෑ.කොන්ත්‍රාත්කරුවකුට මේක කරලා දෙන්න කියලා ගිහින් කියනවා.එතුමා කියනවා මාසෙන් අපිට මුදල් ටික අරන් දෙන්න කියලා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් කියනවා හරි මුදල් දෙනවා කියලා.අර මනුස්සයාට ලක්ෂ විස්සේ පාර ඇත්තටම හදන්න වෙන්නේ ලක්ෂ දහයකින් තමයි.අකාර්යක්ෂම වෙන්න හේතුව අර මුදල් කවදා ලැබෙයි ද දන්නේ නෑ.ලක්ෂ පහක් තියාගෙන වැඩේ පටන් ගත්තා නම් ගණන් හදලා බැලුවොත් තව ලක්ෂ පහක් 10% ගණනේ පොලියට ගත්තොත් මාස දහයක් ගියොත් ලක්ෂ 20 ම ගිහින් ඉවරයි.අපිට යෝජනා දුන්නාම මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සල්ලි දීලා මේ ලක්ෂ 20 පාර,කවුරුත් හොරකම් කරන්න කරන වැඩක් නෙවෙයි මේක.මිනිස්සු අතේ සල්ලි නැති නිසා තමයි අඩුවට සිමෙන්ති දාන්නේ,අඩුවට කරන්නේ.කෙහොම හරි වැඩි ලාභයක් ගන්න බලන්නේ අපිට සල්ලි කවදා ලැබෙයිද කියන බය නිසයි.ඒ වෙලාවේම සල්ලි ටික දුන්නොත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරී මණ්ඩලයට ගිහින් අධීක්ෂණය කරන්න පුළුවන්.ලක්ෂ 20 පාර කරගෙන යන අතරතුර ලක්ෂ දහයක්වත් ලබා දෙන්න පුළුවන් නම් ඒ කොන්ත්‍රාත්කරුවා තව මීටර් පහක් ඉදිරියට හදන්න තිබුණොත් ඒ මීටර් පහත් එතුමාගේ මුදල් වලින් සිදු කරනවා.අපි සියලු දෙනාම එකතු වෙලා මේක යෝජනාවක් විදිහට ගෙනත් කිනම් රජයකින් හෝ මුදලක් ලබා දෙනකොට ඒ මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ කුමන ආයතනයකට හෝ ලබා දීලා වැඩේ අවසන් වූ විගස ඒ කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ලබා දෙනවා නම් ඉදිරියට කටයුතු කිරීමේ දී අපිට ඉතාම පහසු වෙනවා.ගරු සභාපතිතුමණි,අපි එකතු වෙලා පක්ෂ භේදයකින් තොරව ඒ ඉල්ලීම කරමු.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමණි,පඩුවස්නුවර ආසනයේ නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෑහෙන ප්‍රමාණයකට ඒ රැඳවුම් මුදල ලබා දුන්නා.මේ වන විට මේ කිසිම කෙනෙක් කොන්ත්‍රාත් ලබා ගන්නේ නෑ.පසුගිය කාලයේ අවුරුදු හතරක් පහක් පුරාවට මේ කොන්ත්‍රාත් ලබා ගත්තා.හැබැයි දැන් කිසිම සමිතියක් හෝ කිසිම කෙනෙක් මේ කොන්ත්‍රාත් ලබා ගන්නේ නෑ.හේතුව තමයි අපි වැඩ විෂය දෙනවා,දිස්ත්‍රික් ලේකම්තුමා ඒක අනුමත කරලා එවනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට.මුදල් ඇවිත් නෑ.31 වෙනිදාට කලින් වැඩ ඉවර කරන්න කියලා එවනවා.එක් පුද්ගලයෙක් මට කතා කලා.එතුමා දෙසැම්බර් 31 ට කලින් ලක්ෂ 30 ක ව්‍යාපෘති දෙකක වැඩ අවසන් කරන්න එතුමාගේ අයියාගේ ලොරිය ලක්ෂ 24 කට තිබ්බා.අද ගෙවා ගන්න විදිහක් නැතිව එතුමා අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා.ඒ වගේම ලක්ෂ 40 ක් කොට්ඨාස දිනපු අපේ මන්ත්‍රීවරුන්ට ලැබුණා.මේ වන විට ලක්ෂ 70 ක් ගෙවන්න තිබෙනවා නැගෙනහිර.හැබැයි ඇවිත් තිබෙන්නේ ලක්ෂ 30 යි.මම දන්න තරමින් පඩුවස්නුවර මේ මන්ත්‍රීවරුන්ට කෝටි අටක් විතර දීලා තිබෙනවා.හැබැයි කෝටි අටෙන් ලක්ෂ 30 යි 31 වෙනිදාට ගෙවන්න ඇවිත් තිබෙන්නේ.මම ස්තුතිවන්ත වෙනවා නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට,ඔවුන්ට ලැබෙන ආදායමින් ඉතිරි මුදල පියවන්න කටයුතු කර තිබෙනවා.ඔවුන් හැමදාම ඒ කටයුතු බොහෝම උනන්දුවෙන් කරනවා.මින් ඉදිරියට කවුරුත් මේ කොන්ත්‍රාත් බාර ගන්නේ නෑ.මේ මුදල් එනතුරු මේ කටයුතු සිදු වෙනවා නම් තමයි හොඳ.සම්බන්ධීකරණ කමිටුවට මේ සම්බන්ධව විශේෂයෙන් ඉල්ලීමක් කරන්න.මුදල් ඇවිත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුමට බැර වීමෙන් පසු මේ සියලු කටයුතු සිදු කරන්න කියන කාරණය කියන්න.මේ කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ලබා දීමට කටයුතු කරන්න.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

මේ යෝජනාව කාලීන යෝජනාවක්.මහජන නියෝජිතයින් හැටියට අපිත්,ගමේ ස්වේච්ඡා සංවිධානවල නිළධාරීන් හැටියට ගමට ආදරය කරන මිනිස්සු වශයෙන් ගමට යම් මුදලක් ආවාම දේශපාලන අධිකාරිය හා රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ කරලා ඒ ව්‍යාපෘතියේ වැඩ අවසන් කරනවා.අපිටත් මහජන නියෝජිතයින් හැටියට ලොකු වගකීමක් තිබෙනවා,ඒ අයට අපේ අවශ්‍ය සහයෝගය ලබා දෙන්න.ඒ වගේම ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු සියලුම රාජ්‍ය නිළධාරීන් මහත් පරිශ්‍රමයක් ගන්නවා මේ අරමුණ යථාර්ථයක් බවට පත් කරන්න.ව්‍යාපෘතිය පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට භාජනය වෙද්දී ඒ ව්‍යාපෘතියට මුල් ගල තබන්න,වැඩ ආරම්භ කරන්න කියලා තමයි අපිට දැනුම් දුන්නේ.මේක දීර්ඝ කාලයක ඉඳන් මේ ක්‍රමවේදයේ තිබෙන දැවැන්ත ගැටළුවක්.චක්‍රලේඛ හා උපදෙස් මත තමයි නිලධාරීන්ට ක්‍රියාත්මක වෙන්න සිදු වෙන්නේ.නිලධාරීන් දැඩි අපහසුතාවට පත් වී තිබෙනවා.අපේ රජයේ අපි අත්සන් කරන්නේ ඒක පුද්ගලික ගිවිසුමක් කියන එක තමයි මගේ විශ්වාසය.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ ප්‍රාදේශීය සභාව හෝ ස්වේච්ඡා සංවිධානයක් ගෙන්නලා ගිවිසුම් අත්සන් කරනවා.මෙම ගිවිසුමේ ප්‍රමාද ගාස්තු කැපීම් සහ අනෙකුත් සියලුම දේවල් යොමු කරලා තිබෙන්නේ ස්වේච්ඡා සංවිධාන වලට.ව්‍යාපෘතිය අවසන් කරලා,ගෙවීම් වාර්තාව සකස් කරලා වැඩ අවසන් කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික

අංශයට හෝ අපේ සභාවට හෝ භාර දුන්නාම එතනින් එහාට දෙවන පාර්ශ්වයට සාධාරණයක් ඉටු වෙන ක්‍රමවේදයක් නෑ.ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා සඳහන් කලා 2019 වර්ෂයේ සපිරි ගමක් වැඩසටහන ක්‍රියාත්මක වෙද්දී ආණ්ඩු පෙරලියක් සිදු වුනා.ඉන් පසුව බලයට ආවේ අපේ ආණ්ඩුව.සපිරි ගමක් වැඩසටහන යටතේ කල ව්‍යාපෘති වලට මුදල් ගෙවන්න සිදු වුණෙත් අපේ ආණ්ඩුවටයි.බොහෝ විට සිදු වන්නේ ආණ්ඩු බලයට පත් වූ පසු ඔවුන් සුදුසු යැයි කියන නව ව්‍යාපෘති ආරම්භ කිරීමයි.ඒ තුලින් වසර ගණනාවක් කලින් ව්‍යාපෘති කල ස්වේච්ඡා සංවිධාන වලට සිදු වන්නේ වසර ගණනාවක් මුදල් ප්‍රමාද වීමයි.විය යුත්තේ කවුරුන් හෝ වේවා නීත්‍යානුකූලව නිවැරදිව ව්‍යාපෘතියක් වැඩ නිම කර ඇත්නම් එහි මූලික මුදල හා රැඳවුම් මුදල නිදහස් කිරීමයි.ගම සමඟ පිළිසඳර වේවා,එක ගමකට එක වැඩසටහනක් වේවා,තමන්ගේ අනන්‍යතාව හදා ගන්න වෙනින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කලත් ආණ්ඩුවල සිටින පාලකයන් දන්නේ නෑ මේ හැම ව්‍යාපෘතියකම ගිවිසුම් අත්සන් කරන්නේ ගමේ ස්වේච්ඡා සංවිධානවල එකම නිලධාරී පිරිසක් කියලා.ආණ්ඩු වෙනස් උනාට ගම් නියෝජනය කරන ස්වේච්ඡා සංවිධානවල මේ ව්‍යාපෘති වල දී ක්‍රියාත්මක වෙන්නේ එකම පිරිසක්.අපි දේශපාලන පක්ෂ නියෝජනය කරන ප්‍රාදේශීය දේශපාලන නායකයෝ.ඒ නිසා මම විශේෂයෙන් මතක් කරන්නේ තම තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂ වල නායකයින් පාර්ලිමේන්තුව තුල,එනම් රටේ නීති සම්පාදනය කරන ආයතනවල තමයි වාඩි වෙලා ඉන්නේ.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා පෙ.ව.12.13 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

මේකට ජාතික ප්‍රතිපත්තියක්,ජාතික ක්‍රමවේදයක් සකස් කලේ නැතිනම් ඉදිරියට මොන ආණ්ඩුව ආවත් මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන එක දැඩි අසීරුතාවකට පත් වෙනවා.මුදල් වල තිබෙන වටිනාකම ඉහල පහල යනවා.අපි ග්‍රාමීය ජනතාව නියෝජනය කරන පිරිසක් හැටියට මේ ක්‍රමවේද වෙනස් කිරීම සඳහා දැඩි උත්සාහයක් මේ සඳහා යොමු කල යුතුයි.දැන් ව්‍යාපෘති රාශියක් ඇවිත් තිබෙනවා.නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ වර්ෂයේ මාර්තු 31 ට පෙර වැඩ අවසන් කල සියලු ව්‍යාපෘති වල ගෙවීම් කටයුතු අවසන් කලා.ඒ වගේම අපනයන ගම්මාන වැඩසටහන්වල ගම්මාන තුනක් මා දන්නා තරමින් ක්‍රියාත්මක උනා.කොළඹගම හැරෙන්න අනෙකුත් අපනයන ගම්මාන වල සියලු මුදල් නිදහස් කලා.ඒ සඳහා විශාල පරිශ්‍රමයක් සිදු කල නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා,සැලසුම් අධ්‍යක්ෂකතුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයට අපේ විශේෂ ස්තූතිය පුද කර සිටිනවා.2019 ඉඳන් කොන්ත්‍රාත්කරුවන්ගේ හෝ ස්වේච්ඡා සංවිධානවල අයට රැඳවුම් මුදල් ගෙවලා නෑ.ගරු සභාපතිතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කරනවා.ලේකම්තුමන්ලා පරිපාලන නිලධාරීන්ගේ ක්ෂේත්‍රය නියෝජනය කරනවා.අපි මහජනතාව නියෝජනය කරනවා.මේ හැම ක්ෂේත්‍රයකම මේ පිළිබඳව කතිකාවතක් ගොඩනැගුණේ නැතිනම් කවදාවත් මේක යථාර්ථයක් බවට පත් වෙන්නේ නෑ.ඒ නිසා කරලා තිබෙන ව්‍යාපෘතිවල මුදල් ගෙවීම සිදු කල යුතුයි.ජාතික සැලැස්මකට ගෙනියනවා නම් මේ අර්බුදකාරී තත්ත්වය සමතයකට පත් වෙනවා.ඒ වගේම ව්‍යාපෘතියක් කරන්න අපිට දින කිහිපයයි ගත වෙන්නේ.නමුත් එහි ගෙවීම් වාර්තා සකස් කර මුදල් නිදහස් කර ගැනීමට ඒ සමිති වලට දීර්ඝ කාලයක් ගත වෙනවා.රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ආර්ථික සංවර්ධන නිලධාරීන් විශාල පරිශ්‍රමයක යෙදෙනවා.නමුත් ව්‍යාපෘති අවසන් වූ පසු මුදල් නිදහස් කර ගැනීමේ දී එම ව්‍යාපෘති සඳහා මුදල් ලැබී නොමැති වීම හේතුවෙන් ඔවුන්ටත් දැඩි අසීරුතාවකට පත් වෙන්න සිදු වෙනවා.මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් වන පුද්ගලයින් සඳහා ඒ අයගේ මුදල් නිදහස් කර දීමේ වගකීම තිබෙන්නේ අපිට.අපි මේ ගැන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේත් කතා කරමු.මේ ගැන විශේෂ අවධානය යොමු කරන්න.අපේ සභාවේ ගරු සභාපතිතුමා,ලේකම්තුමා ඇතුළු අපේ නිලධාරී මණ්ඩලයට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.මේ සභාවේ අපි වැඩ කරන්නේ සැලසුමක් ඇතිව.සභාවේ යම්කිසි වැඩක් කලොත් සතියක් ඇතුලත අනිවාර්යයෙන් ඒ මුදල් නිදහස් කරනවා.අපේ සභාවේ ඒ කටයුතු විනිවිදභාවයෙන් හා කාර්යක්ෂමව සිදු වෙනවා.මේ විදිහට හැම ආයතනයකම සිදු වෙනවා නම් ගැටළුවක් නෑ.ගරු සභාපතිතුමණි මේ පිළිබඳව කතිකාවතක් හදමු.ඉදිරියේ දී හරි මේ ක්‍රමවේදය නිසියාකාරව කරගෙන යාමට කටයුතු කරමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි. සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව.මේ අර්බුදයට මැදි වුණ කෙනෙක් විදිහට මමත් බොහෝ අවස්ථාවල අපහසුතාවට පත් වී තිබෙනවා.ග්‍රාමීය මාර්ග වල කොන්ක්‍රීට් ඇතිරීමේ ලක්ෂ 20 පාරවල් අපේ මන්ත්‍රීවරුන්ට කරන්න පුළුවන්කමක් තිබුණේ නෑ.නමුත් බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාර්ග 10 ක් හෝ 15 ක් විතරයි හැදුවේ.එයින් පාරවල් 6 ක් මගේ කොට්ඨාසයේ.ගිය සතියේ තමයි ඒ මාර්ගවල මුදල් ලැබුණේ.මගේ මුණමල්දෙණිය කොට්ඨාසයේ මල්වානේගෙදර වසමේ

ලක්ෂ 15 ක අනුමත වූ මාර්ගය අහිමි වීම බලන් ඉන්න බැරිව ප්‍රදේශයේ විහාරස්ථානයේ ගරුතර ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ ලැබූ වැටුපෙන් එකතු කර ගත් මුදලින් ඒ සඳහා ලබා දුන්නා.උන්වහන්සේට මම පොරොන්දු උනා දෙසැම්බර් 31 වන විට මම මේ මුදල ලබා දෙනවා කියලා.ගිය සතිය වෙනකම් ඒ මුදල් ලැබුණේ නෑ.මම කණගාටුදායක ලෙස දැක්කේ චෙක්පත ගන්න අනුමැතිය ලබා දෙන බලධාරීන් ඒ සඳහා යොමු වෙන ආකාරය.මේක අපේ සමිතිය එකමුතු වෙලා කලේ ලාභයක් ගන්න නෙවෙයි.රැඳවුම් මුදලත් වියදම් කරලා තිබෙනවා.අපේ රජයේ නිලධාරීන් හැටියට ඒ මුදල් වියදම් කල අයට ලබා දෙන්න මූලිකත්වය ගන්නේ නෑ.ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනවා.වෙනත් වැඩසටහන් ඒමට පෙර මෙතුමා කීව කෝටියකට ආසන්න රැඳවුම් මුදල් නිදහස් කිරීමෙන් පසු වෙනත් යෝජනා අරන් ඒ සඳහා අනුමැතිය ලබා දෙනවා නම් මින් ඉදිරියට හරි ගම්වලට වැඩක් කරන්න කෙනෙකුට භාර දීම පහසු වෙයි.පසුගිය කාලයේ රැඳවුම් මුදල් ලබා ගන්න තිබෙන්නේ එකම පුද්ගලයින්ටයි.මුදලේ අගය අඩු වුණාට පසු රැඳවුම් මුදල දෙකින් පංගුවකට අඩු වී තිබෙනවා.ලක්ෂ 30 ව්‍යාපෘති වලත් මම ගිය සතිය වෙද්දී පාරක් අවසන් කලා ලක්ෂ 10 ක ප්‍රතිපාදන යටතේ.අපේ සභාවේ අරමුදල් වලදී අපේ තාක්ෂණ නිලධාරීන් යොමු වෙලා බිල්පත් ඉදිරිපත් කරලා ගෙවීම් කරන්න සියලු කටයුතු මේ වනවිට සූදානම් කරලා ඇති.නමුත් ඒ මාර්තු 31ට වැඩ අවසන් කල ව්‍යාපෘති වල මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් කවදා ලැබේවිද කියන්න විදිහක් නෑ.සභාව තුල කරන සැලසුම් සහගත වැඩ වලට ස්තුතිවන්ත වෙනවා.පක්ෂ භේදයක් නැතිව මහජන නියෝජිතයින් ලෙසට හැම පක්ෂයකම අවධානය යොමු කරගන්න මෙය අවස්ථාවක් කර ගමු.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

මෙම ගැටළුව මම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කරලා ඒ මඟින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට අපි කටයුතු කරනවා.

පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017/2018/2019 වර්ෂවල ඉදි කල ව්‍යාපෘති වෙනුවෙන් රඳවා ගත් රැඳවුම් මුදල් ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් දැනුවත් කිරීමත්,එතුමන් මඟින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීමට කටයුතු කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017/2018/2019 වර්ෂවල ඉදි කල ව්‍යාපෘති වෙනුවෙන් රඳවා ගත් රැඳවුම් මුදල් ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් දැනුවත් කිරීමත්,එතුමන් මඟින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීමට කටයුතු කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## III.කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව - (විශේෂ යෝජනා)

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව විශේෂ යෝජනාවක් ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය ඉදිරිපත් කර තිබෙනවා.ඒ සඳහා එතුමියට අවස්ථාව ලබා දෙනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>

කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.පසුගිය පළාත් පාලන මැතිවරණයේ දී අපට 25% කෝටාව යටතේ පළාත් පාලනය නියෝජනය කරන්න ලැබීම සතුටට කරුණක්.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය පෙ.ව.12.23 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ඒ වෙනුවෙන් මහන්සි වුන දේශපාලනඥයින්, රාජ්‍ය නිලධාරීන්, සමාජ ක්‍රියාකාරීන් යන සියළු දෙනාගේ කැපවීම මත තමා අපට 25% කාන්තා නියෝජනය ලැබුණේ.එදා ඉඳන් අද දක්වාම පළාත් පාලන නියෝජිතවරියන් සමාජ ක්‍රියාකාරී කටයුතු සම්බන්ධයෙන්,ප්‍රජා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අපගේ ක්‍රියාකාරීත්වය යොදා වැඩ කරගෙන යනවා. ඇත්තටම එදා ඉඳන් අද වෙනකල් කාන්තාවන්ගේ ගැටළු, ප්‍රශ්න ගැන කථා කරන්න වේදිකාවක් තිබුනේ නෑ. මේ 25% කෝටාව යටතේ අපට කථා කරන්න වේදිකාවක් ලැබුණා. පසුගිය දවසක පුවත්පතක සඳහන් වෙලා තිබුනා කාන්තා නියෝජනය 16% කින් අඩු කිරීමක් සාකච්ඡා කරමින් පවතිනවා කියලා.තවම එය බලාත්මක කරලා නෑ.නමුත් අපි ඒ වෙනුවෙන් සාකච්ඡා කරන්න ඕනි. ඇත්තටම අපි කාන්තාවන් විදියට විවිධ තනතුරු හා සියලු කටයුතු වල නියැලෙමින් අපේ ශ්‍රම දායකත්වය ලබා දෙනවා.ඉතින් අපිට ඇතිවන ගැටළු, ප්‍රශ්න ගැන කථාකරන්න හොඳම වේදිකාව

තමයි මේ.අපි ගෘහස්ත හිංසනයට යටත් වනවා වගේම පසුගිය දිනවල මම දැක්කා පුවත්පත් වල තිබෙනවා විවිධ බලපෑම් වලට ලක්වන දියණිවරු මේ සමාජයේ ඉන්නවා.ඒ හින්දා මම කියන්නේ 25% කෝටාව ඉදිරියටත් රැගෙන යන්න ඕන.පසුගිය දිනවල විවිධ තරුණ තරුණියන් අපේ සමාජයේ යම් යම් ගැටළු ඔවුන්ට හැකි අයුරින් වේදිකාවක් හොයාගෙන කතා කලා.සිංහරාජ වනය ගැන තරුණියක් කතා කලා.ඒ වගේම විවිධ නිලධාරිණියන් සමාජයට යම් හඬක් නැඟුවා.තව ද දේශපාලනයෙන් අපේ රටට ලොකු මෙහෙයක් කරපු කාන්තාවන් සිටිනවා.ඒකට හොඳම විසඳුම ලෙස අපේ රටේ ප්‍රථම අගමැතිනිය දක්වන්න පුළුවන්.ඒ වගේම ජනාධිපතිනියක් බිහි වුණා.ඇත්තටම කාන්තා නියෝජනයේ අපි ආ දිනයේ සිට විවිධ ආයතනවලින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.එහෙම කරන්නේ පිරිමි පාර්ශ්වයට සාපේක්ෂව කාන්තා නියෝජනයෙන් හොර,බොරු,වංචා වැළකෙනවා කියලා සමාජයේ යම් ආකල්පයක් තිබෙනවා.මේ වගේ ව්‍යසනකාරී තත්ත්වයන් ඇති වූ රටවල් තුල කාන්තා කණ්ඩායම් එකතු වෙලා ඒ රටවල් ගොඩ ගත් අවස්ථාවන් අපිට ලෝකයේ දකින්න පුළුවන්.අපි සම අවස්ථා ඉල්ලන්නේ නෑ.අපි ඉල්ලා සිටින්නේ 25% රැකලා දෙන්න කියලා.දළදා කරඬුවට වඳින්න පිරිමි අයට යන්න දුන්නත් කාන්තාවන්ට ඒ අවස්ථාව නෑ.නමුත් හේමමාලා කුමරිය තමයි ගෙන ආවේ.ඒ වගේම ශ්‍රී මහා බෝධිය වැඩම කලේ සංඝමිත්තා තෙරණියයි.නමුත් එතනටත් කාන්තාවන්ට යන්න අවස්ථාවක් නෑ.ඒ වගේම එදා විහාර මහා දේවිය රට ගොඩ ගන්න ඉදිරිපත් වුණා.අපේ රටේ කාන්තාවන් බොහෝම ශක්තිමත්.අපේ ප්‍රශ්න,ගැටළු කතා කරන්න අපේ 25% කෝටාව රැක ගැනීමට සියලු දෙනාගේම සහයෝගය අවශ්‍යයි. 25% කෝටාව 16% කින් අඩු කිරීමට ඉඩ ලබා නොදෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

මං හිතන්නේ නිශාන්ති මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව හොඳයි. 25% තිබුන කාන්තා නියෝජනය 16%ට අඩු වීමෙන් අපට අසාධාරණයක් තමයි වෙන්නේ.මේ 25% නියෝජනය නිසා තමා අපේ සභාවෙත් කාන්තාවන් පිරිස වැඩිවුනේ.ඡන්දෙන් පත් වුනේ 03දෙනයි. ඉතිරි 06 දෙනාම ආවේ බෝනස් ක්‍රමයට.පසුගිය මාසයේ අපේ සභාව යෙදි තිබුනේ කාන්තා දිනය දවසේ.එදා අවසානයේ බොහොම අතලොස්සයි හිටියේ.කාන්තාවෝ හැටියට අපි එදා කීපදෙනෙක් කථාකරා.අපි කනගාටු වෙනවා ඒ අවස්ථාවේ බොහෝ දෙනෙක් ඒ වෙලාවේ නොසිටපු එක ගැන.සභාවක් උනාව අවසන් වනතුරු ඉන්න ඕන.ඒ වගේම කාන්තාවන්ට පමණයි දිනයක් තිබෙන්නේ.පිරිමි පාර්ශ්වයට නෑ.ඒ නිසා අපි කාන්තාවන්ට දිනයක් තිබීම සම්බන්ධව ආඩම්බර වෙනවා.තවද මං අහලා තියනවා සෑම සාර්ථක පිරිමියෙක් පිටුපසම ඉන්නේ සාර්ථක, ශක්තිමත් ගැහැණියක් බව. තමන්ගේ දේශපාලන ගමන වේවා, ව්‍යාපාර ගමන වේවා මොනයම් හෝ දෙයක් වේවා ඒ පිටුපස සිටින්නේ තමන්ගේ ස්වාමි දියණියයි.තවද ඒ ලැබෙන ශක්තිය වචනයකින් කියලා නිම කරන්න බෑ. ඒ ගෞරවය අපිට ලැබිලා තියනවා අපි කාන්තාවන් විදියට. ඒ ගැන අපි බොහෝම සතුටු වෙනවා. වංචා දූෂණයට අදාලව කාන්තාවන්ගේ යොමු වීම අඩුයි කියන එක සියයට සියයක්ම සත්‍යයක්.අපි පසුගිය දවස්වල රාජ්‍ය නොවන ආයතන හා අර්ධ රාජ්‍ය ආයතන වලින් පැවැත්වූ වැඩසටහන්වලට සම්බන්ධ වුනා.එහිදි කාන්තා නියෝජනය වැඩිකරන්න බලාත්මක කරන්න සාකච්ඡා වුනා.තවද ලංකාවේ පුරවැසියෙක් නිසා සතුටු වෙනවා ලෝකයේ ප්‍රථම අගමැතිනිය බිහිවුන රට ලංකාව වීම නිසා.එතුමිය හැත්තෑ ගණන්වල මේ රට ගොඩනගන්න දායකත්වය ලබාදුන්නා. 25% කාන්තා නියෝජනය මේ විදියටම තියනවා නම් හොඳයි. අපිටත් ශ්‍රමය ශක්තිය යොදලා රටට වැඩක් කරන්න පුළුවන් තවද අපිටත් ශක්තියක් වෙන්න මේ මන්ත්‍රීවරුන් වැඩකරනවා නම් හොඳයි.නොකරනවා කියනවා නෙවෙයි. නිවසේ සිටින කාන්තාවත් උදේ ඉඳන් සවස් වන තුරු විශාල වැඩ කොටසක් කරනවා.කාන්තාවක් ආයතනයකට යන්නේත් වැඩ කරන්න.නිවසට එන්නේත් වැඩ කරන්න.කාන්තාවගේ ගෞරවය ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කල යුතුයි.ඉදිරියේ දී මේ සම්බන්ධව මීට වඩා අවධානය යොමු කරලා මේ සම්බන්ධව අපිට හඬක් නගන්න අපිත් එක්ක එකතු වෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

<u>**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**</u>

ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය චෝදනාවක් කරා ගිය මහ සභාවේ කාන්තා දිනය වෙනුවෙන් යෝජනාවක් ඉදිරිපත් කරලා,ඒ අවස්ථාවේ සභාවේ මන්ත්‍රීවරුන් නොසිටීම සම්බන්ධයෙන්.ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනවා.ඒක අපි හිතලා කල දෙයක් නෙවෙයි.නිශාන්ති මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් මාත් එකඟවෙනවා.25% කාන්තා නියෝජනය ඒ ආකාරයෙන් තිබිය යුතු බවයි මගේත් අදහස.25% කාන්තා නියෝජනය අඩු කිරීම සම්බන්ධව අපේ විරෝධය පල කරනවා.මෙම ප්‍රතිශතය වැඩි කලත් කමක් නෑ,අඩු නොකර තැබීම සුදුසුයි.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

මං විශේෂයෙන්ම නිශාන්ති මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාවට සුභාශිංසනය කරනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීතුමියන්ලාගේත් අපි මන්ත්‍රීතුමියන්ලා 9 දෙනා වගේම එකමුතුවක් තිබෙනවා.කාන්තාව නැතිව පිරිමි කිසිම දෙයක් කර ගන්න බෑ.විශේෂයෙන් අපේ යෝජනා වන්නේ 25% කෝටාව අඩුකරගන්නේ නැතිව ඒ තුලවත් පවත්වා ගැනීමටයි. 25% කෝටාව 16% දක්වා කෝටාව අඩු කරන යෝජනාවට මාත් විරුද්ධයි.ඉතින් අපි 9 දෙනාම මේ සභාව තුල හඬක් නගනවා.ඉතින් ඒ ශක්තිය අපිට දෙන්න ඔබ සියළු දෙනාම ඒ පිටුපස ඉන්න කියන යෝජනාව ඉදිරිපත් කරනවා. 25% කෝටාව ඉක්මවා යන්න උනත් අවස්ථාව තියෙයි.බොහෝ කාන්තාවෝ වැරදි ක්‍රියාත්මක කරන්න අත ඔසවන්න මැලි කමක් දක්වනවා.ඒ නිසා තමයි කාන්තාව විශේෂ වන්නේ.මං හිතනවා මේ යෝජනාව ඉදිරි කටයුතුවලට පිටුවහලක් වෙයි කියලා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

මං පලමුවෙන්ම නිශාන්ති මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා.අපි දන්නවා අද සමාජයේ කාන්තා නියෝජනය තමා වැඩි කියලා.නමුත් මේ දේශපාලන අධිකාරිය තුල කාන්තා නියෝජනයේ 25% කෝටාව 16% දක්වා අඩු කිරීම පිළිබඳව අපි ඇත්තටම කනගාටු වෙනවා.අපි ඒක අනුමත කරන්නේ නෑ.නිවසක මවගේ අදහස් අනුව තමයි පියා කටයුතු කරන්නේ.අද සමාජයේ තියන සමිති සමාගම් ගත්තාම වැඩි නියෝජනයක් දක්වන්නේ කාන්තාවන්.සියලූම සංවර්ධන කටයුතු වල දී කාන්තාවන් මූලිකත්වය ගන්නවා නම් ඇයි මෙතන දී විතරක් බැරි.ඈත අතීතයේ සිටම ගත් කල කාන්තා නියෝජනයන් සිදු වී තිබෙනවා.උදාහරණයක් ලෙස ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියයි.පසුගිය සභාව දවසේ කාන්තා අපිට සුවශේෂී දිනයක්.නමුත් මට පැහැර හැරිය නොහැකි රාජකාරී කටයුත්තක් යෙදී තිබූ නිසා මට අකමැත්තෙන් උනත් සභාවන් පිට වී යන්න සිදු වුණා.එදින මගේ සහෝදර කාන්තා මන්ත්‍රීවරියන් තනි කර යාමට සිදු වීම පිළිබඳව මගේ කණගාටුව ප්‍රකාශ කරනවා ඉදිරියේ දී 25% කෝටාව මේ විදියටම රැකගන්න උත්සාහ කරමු.හඩ අවදි කරමු.අපේ ශක්තිය යොදා ගනිමින් රට ගොඩනැගීමට දායක වෙමු කියලා ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

මුලින් ම මං නිශාන්ති මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව අගය කරනවා වගේම අපේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා.අපේ සභාවේ මන්ත්‍රීවරියන් 09 දෙනෙක් සිටිනවා.දේශපාලන භේදයකින් තොරව අපි 09 දෙනාම සහයෝගයෙන් වැඩ කටයුතු කරනවා.අද සමාජයේ තියන සමිති සමාගම් ගත්තාම වැඩි නියෝජනයක් දක්වන්නේ කාන්තාවන්.ඒ වගේම සෑම සාර්ථක පිරිමියෙක් පසුපසම කාන්තාවක් සිටිනවා.ඉතින් අපේ 25% කෝටාව ඉදිරියටත් පවත්වාගෙන යන්න මන්ත්‍රීතුමන්ලා වශයෙන් ඔබ සියලු දෙනාගෙත් සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය - (එ.ජ.නි.ස.)</u>**

මං මුලින් ම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාවේ දී 25% කෝටාව ලබාදුන්නු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ට.ඇත්තටම 16% දක්වා අඩු කිරීම පිළිබඳ මං විරුද්ධයි.ශ්‍රී ලංකාවේ 53%ක් කාන්තාවන් සිටින්නේ.ඒ අනුව බලනවිට 25%ත් මදි කාන්තා නියෝජනය.අඩුම වශයෙන් 50% ක්වත් තියෙන්න ඕනි.එහෙම වුනා නම් මේ රට මීට වැඩිය වෙනස් වෙන්න තිබුනා.දූෂණයෙන් තොර රාජ්‍යයක් වෙන්න තිබුණා.ඒ වගේම ප්‍රථම අග්‍රාමාත්‍යතුමිය වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පක්ෂයේ දියණියක් වීම පිළිබඳවත් මා ඉතා ආඩම්බර වෙනවා.ඉතින් මං ඉල්ලන්නේ සාධාරණ ප්‍රතිශතයක් කාන්තා නියෝජනයටත් ලබා දෙන්න කියලා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා පෙ.ව.12.54 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය - (එ.ජා.ප.)</u>**

මං මුලින්ම ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාවලියට කාන්තා නියෝජනය හොඳයි කියලා හඳුන්වා දුන් ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ට ස්තූතිවන්ත වෙනවා.තවද 25% කාන්තා නියෝජනය ඒ ආකාරයෙන් ම රඳවා ගැනීමට නිශාන්ති මන්ත්‍රීතුමිය මේ සභාව තුලට ගෙනාපු යෝජනාව ඉතා කාලෝචිත එකක් බව සිහිගන්වනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

අප සභාවේ සියළුම කාන්තාවන්ට 25% කාන්තා නියෝජනය තවදුරටත් පවත්වාගැනීම සඳහා කථා කරන්න අවස්ථාව ලබාදුන්නා. කරනවා.පිරිමි පාර්ශවය වෙනුවෙන් අපේ උප සභාපතිතුමා සියලු මන්ත්‍රීවරුන් නියෝජනය කරමින් අදහස් ඉදිරිපත් කලා.

කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව කාන්තා නියෝජිතවරියන්ගේ 25% කෝටාව සුරක්ෂිත කිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## IV.වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුද තත්ත්වය පඹුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුද තත්ත්වය පඹුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව විශේෂ යෝජනාවක් ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය ඉදිරිපත් කර තිබෙනවා.ඒ සඳහා එතුමියට අවස්ථාව ලබා දෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)**

වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුද තත්ත්වය පඹුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.පලමුවෙන්ම මගේ කථාවෙන් ඔබතුමන්ලා කිසියම් අපහසුතාවයකට පත් වෙනවා නම් සමාව ඉල්ලනවා.ඇත්තටම වත්මන් අර්බුදය හමුවේ පක්ෂ, පාට කිසිම භේදයකින් තොරව අප සියලු දෙනාම අපහසුතාවයකට පත්වෙලා සිටින්නේ.ඇත්තටම ආපනශාලාවක් පවත්වාගෙන යන කෙනෙක් විදියට ගෑස් එකක් නැතිව පත්වෙලා තියන අපහසුතාවය ගැන කියලා විස්තර කරන්න ඕන නෑ.ඒ වගේම තමා අනෙක් සියලු ව්‍යාපාරත් මේ වනවිට බොහෝම අපහසුතාවයට පත්වෙලා තියෙන්නේ.තව ද වාහන සඳහා ඉන්ධන අර්බුදය තියනවා.මේ දේවල් වලට ඉවහල් වුන කාරණාව තමා එක පවුලකට බලය කේන්ද්‍ර ගත වීමයි.එදා පාර්ලිමේන්තුවෙ දී වෙල්ගම මන්ත්‍රීතුමා කීවා වත්මන් ජනාධිපතිතුමාට ජනාධිපති තනතුරට තරඟ කරන්න ඉදිරිපත් වෙන්න දෙන්න එපා කියලා එතුමා මහින්ද රාජපක්ෂ මහතාට කීවාලු. මහින්ද රාජපක්ෂ මහතා ඒක ගණන් ගත්තේ නැත්තේ තමන්ගේ පවුලේ කෙනෙකුට බලය කේන්ද්‍රගත කරන්න තිබෙන අවස්ථාව මඟ හැරී යයි කියලා බව එතුමා නොබියව එදා කීවා.ජනාධිපතිතුමාගේ නම වත් කියන්න දැන් කවුරුත් කැමති නෑ.ඇත්තටම 20 අනුමත කරා කියලා අපිට ඇති වූ එක වාසියක්වත් තියනවා නම් ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිනවා.ඇත්තටම මහජනතාවට එයින් කිසිම සහනයක් ඇති වුනේ නෑ.එයාලා කර ගත්තේ එයාලාගේ පවුලට තිබූ නඩු විභාග ඉවත් කර ගත් එක විතරයි.මේ ආණ්ඩුව පත් වුන දා සිට කුඹුරුවලට තෙල්, පොහොර නෑ.වගා කරන දේවල් ගන්න විදිහක් නෑ.මේ වන විට ඩොලරයේ අගය රු.320ක් වෙලා තියනවා.ඉතින් අපි කොහොමද මේවා වලක්වන්නේ.දැන්වත් මෙවැනි කටයුතු නොවෙන්න මහජනතාව වශයෙන් වග බලා ගත යුතුයි.ඇත්තටම වේදිකාවල බොරු කියමින් ජනතාව මුලාවට පත් කරපු එකේ ආදීනව තමා දැන් අපිට භුක්ති විඳින්න වෙලා තියෙන්නේ.ඇතැම් විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා පවා මේවාට වගකියන්න ඕනි.එදා අවුරුදු 30ක් යුද්ධ කරලා බේර ගත්තු අපේ රටේ ආයාසයකින් තොරව දෙමළ කොඩිය ඉහලට නංවන්නේ නැතිව සිටියා.ඒ බේරගත්තු රටේ අද වනවිට ඇමරිකන් කොඩිය, චීන කොඩිය, ඉන්දියන් කොඩිය එසවිලා.අපි ඒවා බලාගෙන හූල්ලනවා.ඉතින් ඉදිරියට මෙහෙම වෙන්න දෙන්න එපා.ඉදිරියට අපේ දරුවන්ට රටක් තිබිය යුතුයි.ඔබලා අහිංසකයි.ඔබලාගේ පාලකයින් ඔබලාට හොරෙන් රාජපක්ෂ පවුල කේන්ද්‍රගත කරපු එකේ ආදීනව තමා මේ පේන්න තියෙන්නේ.අපේ රටේ දැනටමත් කොයි කොයි ප්‍රදේශ විකුණලාද කියන්න අපි දන්නේ නෑ.අඩුම තරමේ කිරිපිටි වලටවත් පාලන මිලක් යොදා ජනතාවට සහනයක් ලබා දෙන්න ඕන.හාල්,ගෑස් අද කීයද?මේක කොවිඩ් වසංගතයටම භාර දීලා හරි යන්නේ නෑ.කොවිඩ් වසංගතයට අපිට වඩා මුහුණ දුන් බංගලාදේශය නැව් රටවලිනුත් අපි අද ණය ගන්න තත්ත්වයට පත් වෙලා.අපි පළාත් පාලන නියෝජිතයින්ට ඇඟිල්ල දික් කරනවා නෙවෙයි.අපේ රටේ එක කකුලක් තියාගෙන වෙන රටක අනිත් කකුල තියාගෙන ඉන්න පාලකයින් අපිට වැඩක් නෑ.නියම සිංහලයෙක් අපි පාලකයෙක් කර ගත යුතුයි.මේ අවස්ථාව තමා ඒකට සුදුසු වෙලාව.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

නිශාන්ති මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව කාලෝචිත එකක් කියලා තමයි එතුමිය කියන්නේ.අපි කවුරුත් දන්න ඉතාම දක්ෂ ලොව පිළිගත්ත නායකයෙක් තමා ඉම්රාන් ඛාන් කියන්නේ.ඔහු ඉතා පිරිසිදු නායකයෙක්.ඔහුට දැඩි දඬුවම් දීලා දේශපාලනයෙන් අයින් කලා.ඉතින් කොච්චර හොඳ නායකයෙක් හිටියත් වැඩක් නෑ. මේ ආර්ථික අර්බුද එන්නේ කලින් කිය කියා නෙවෙයි. අපි ඇත්තටම පිළිගන්නවා අපේ පක්ෂයේ පුංචි පුංචි වැරදි ටිකක් වුනා.පොහොර ප්‍රශ්නය වුනත් මේ අවස්ථාවේ ටිකක් බලපෑවා.ඇත්තටම කුකුල් ව්‍යාපාරකයින්ට බඩ ඉරිඟු වගාවක් කරන්නවත් පොහොර දුන්නේ නෑ.අතිගරු ජනාධිපති ගෝඨාභය

රාජපක්ෂ මැතිතුමාට කවුරුන් හෝ ලබාදුන් උපදේශයක් මත හෝ වගා කිරීමට යූරියා ලබාදුන්නේ නෑ. යූරියා නැතුව බඩ ඉරිඟු වැවෙන්නෙම නෑ.අවසානයේ අපි බඩ ඉරිඟු ගෙනාවේ පිට රටින්.ඉතින් ඩොලර් අර්බුදය ඉන්ධන මිල ඉහල යාමට බලපෑවා.කලින් සැලසුම් කරලා කටයුතු කරා නම් අපිට මේ අර්බුදයෙන් ගොඩයන්න තිබුණා.ඉන්දියාවේ යාචකයෙක් ඊයේ දින රු.80,000.00 ක් ලංකාවට පරිත්‍යාග කලා මේ අර්බුධයෙන් නිදහස් වෙන්න කියලා.ඉතින් කොයි පාලකයා හිටියත් අපේ රටට මේ අර්බුදයට මුහුණ දෙන්න ඉඩ තිබුණා.ඉතින් මන්ත්‍රීවරු 225 පමණක් නොව අප සියලු දෙනාටමත් යන්න කියලා කිව්වේ.අපිත් ලැජ්ජා වෙන්න ඕන.රංජිත් උපාලි මැතිතුමාගේ කාලයේ අපි සභාවට මෝටර් ග්‍රේඩරයක් ගෙනාවා.එතුමාට ස්තූතිවන්ත වෙන්න ඕන.වෙන සභාවල මෝටර් ග්‍රේඩර් එක්ක ගත්තොත් අපේ මෝටර් ග්‍රේඩරය තමයි තිබෙන හොඳම මෝටර් ග්‍රේඩරය.ඒක හොඳින් නඩත්තු කිරීම සම්බන්ධව ලේකම්තුමාට ස්තූතිවන්ත වෙනවා.බැසිල් රාජපක්ෂ මැතිතුමා හොඳ නායකයෙක් කියලා අදටත් මං කියනවා.එතුමා කීවා මීගමුවේ බස්නැවතුම්පල හදලා උඩු මහලේ සිනමා ශාලා 2ක් හැදුවලු.චිත්‍රපට බලන්න කවුරුත් එන්නේ නැලු එයා ෆේල් කියලා කීවා.ඉතින් එක එක්කෙනාට වැරදි වෙන්න පුළුවන්.විදුලිය උනත් ඒකකයක් 65 කට අරන් තමයි රු.7.50 ට දෙන්නේ.ඒ වගේම මගේ පුද්ගලික මතය නම් අපිට සහනාධාර අවශ්‍ය නෑ.නිශාන්ති මන්ත්‍රීතුමිය කොහොම කීවත් අපේ රටට වෙච්ච හානිය වලක්වන්න නම් පක්ෂ පාට භේද නොසලකා අපි හැමෝම එකතු වෙන්න ඕනි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා- (එ.ජා.ප.)</u>**

විශේෂයෙන්ම අපේ රජයේ තියෙන ප්‍රශ්න ගැන කථා කරන්න කලින් කාන්තාවන් ගැන කථා කරන්නම්. සියලු මන්ත්‍රීතුමියන්ලා සමඟ මං සිටගන්නවා.ඉතින් ඔබතුමියන්ලාට කාන්තා නියෝජනය 25% නොව 30% ක් දෙනවා කීවා නම් ඒත් අපි අනුමැතිය දෙනවා.ඉතින් වර්තමාන රජය ගැන කථාකරනවා නම් බොහොම දුක්ඛිතයි.බොහොම ආයාසයෙන් තමා කථා කරන්න වෙන්නේ.විශේෂයෙන්ම වර්තමාන රජය අපොහොසත් වෙලා තියනවා ජනතා සුභසිද්ධිය සම්බන්ධයෙන්.පළමුවෙන්ම ජනතාවට එල්ල කරේ පොහොර ප්‍රශ්නය.ඊට කලින් කහ පිලිබඳ ප්‍රශ්නය ඇතිවුනේ.රටේ සංවෘත ආර්ථිකය හදන්න කහ වගා කරේ.ඒක හොඳයි.ආකල්පයත් හොඳයි.නමුත් ඒක එකපාරම කරන්න බෑ.ඒකෙන් වුණේ කහ වෙනුවට මිනිස්සුන්ට දුන්නේ වස.රජය වගා කරලා ගත්ත වෙහෙසට, මුදලට වඩා ඒවා කාපු මිනිසුන්ට ඒවාට බේත් කරන්න සෑහෙන වියදමක් යනවා.ඒකයි මං කියන්නේ එකෙන්ම ෆේල් කියලා.රජයට බල කරනවා හොඳ විසඳුමක් ගන්න හැකියාවක් නැත්තම් හැකියාවක් ඇති අයෙක්ට කරන්න දෙන්න කියලා.ගොවි ජනයාගේ පොහොර ටික ලබාදෙන්න.පොඩි දරුවන්ට දෙන්න කිරිපිටි ටිකක් ගන්න නෑ, ගෑස් ටික ගන්න නෑ, ඉන්ධන ටික ගන්න නෑ.අදූරදර්ශී නායකයෝ මේවාට වගකියන්න ඕනි.ඩොලර් වලට අද මොකද වුනේ.ඒවාට කථා කරන්න කෙනෙක් නෑ.අවුරුදු කාලේ එනවා බඩු ගණන් ගිහින්.මේකේ කළමනාකරණයක් නොමැති නිසා තමයි මෙහෙම වෙලා තියෙන්නේ.ප්‍රාදේශීය නියෝජිතයෙක් විදියට අපි පාරේ බැහැලා යන්න ඕන. ඡන්දයක් ඉල්ලන්න ආයේ යන්නේ කොහොමද.අපිට පඬුවස්නුවර ජනතාව වෙනුවෙන් විතරක් නෙවෙයි රටටම කියන්න ඕන මේ දේ.සීතල කාමරවල ඉඳන් තීන්දු තීරණ ගන්නවා.ජනතාව ගැන බලන්නේ නෑ. ජනතාව දුක් විදිනවා.අතීතයේ කැලණියට මැණික් ගෙනාපු නාගයෝ හිටියේ.අද මේකේ දිය පොදක් නෑ. හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා කිව්වා කරන්න පුළුවන් දේ කරන්න කියලා.එතුමාගේ ලක්ෂ දෙකහමාර අවුරුද්දක් යනකල් දෙන්නම් කිව්වා.ඒක හොඳ සංකල්පයක්.නමුත් මේ රටේ හොරු ඉන්න කල් මේ රට ගොඩදාන්න හම්බෙන්නේ නෑ.ඉතිහාස පොත්වල තියනවා අයියලා මල්ලිලාට එක අවුරුද්දක් ආණ්ඩුව කරගෙන යන්න බැරිවුනාලු.ඒ වගේ තමා දැන් අපේ රටේ තියන රාජපක්ෂ පවුල, සහෝදර ආණ්ඩුවටත් මේක කරන්න බෑ.පාස්කු ප්‍රහාර සංවිධානය කරලා,ලේ ගංගා වගුරවලා මේ ආණ්ඩුව අතට ගත්තේ.මා එක්ක ගිය සතියේ මුස්ලිම් කාන්තාවක් කථා කලා.ඇය කියනවා ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ විපක්ෂයේ කට්ටිය කීවාලු බුර්කාව අයින් කරන්න කියලා.එයා කියනවා ලංකාවේ ව්‍යසන කරපු එකේ පාපයලු දැන් අපි ගෙවන්නේ කියලා.තවද ඇය කියනවා අපි බුර්කාව දාගෙන ඉන්නේ අපහසුවෙන්ලු.අපි ආගමට ගරු කරන නිසාලු බුර්කාව දාගෙන ඉන්නේ.ඉතින් ඒ මිනිස්සු එයාලගේ ආගම වෙනුවෙන් මේ දේ කරන්නේ.අපි මොන දේ කතා කලත් රාජපක්ෂ පවුල මේ ආණ්ඩුවෙන් අයින් විය යුතුයි.ඒ වගේම සෞභාග්‍ය උදාවෙන්න නම් මේ කරුමක්කාරයින් එලවලා දමලා මිනිසුන්ට ජීවත් වෙලා ඉන්න පුළුවන් රටක් හදන්න,ගොවියන්ට පොහොර ටික දෙන්න, දරුවට කිරිපිටි ටික දෙන්න, අත්‍යවශ්‍ය ආහාරවල මිල අඩු කරන්න.රටේ ජනතාවට ආදරය කරන රජෙක් බිහි කරලා ඒ කටයුත්ත හරියට කරන්න කියන ඉල්ලීම පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ නියෝජිතයෙක් විදියට ඉල්ලනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)</u>**

මේ රටේ මේ වෙලාවේ බොහෝ නගර වල ජනතාව පාරට බැහැලා කතා කරන වකවානුවකයි අපිත් මේ විදිහට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම පවත්වන්නේ.ගම් මට්ටමේ පුංචිම තැනින් දේශපාලනය පටන් ගත් අපි තමයි බොහෝ වේලාවට පීඩනයට පත් වෙන්නේ.ඉහල නායකයින්ට වඩා ගමේ සෑම තැනකම ගිහින් සෑම දේකටම මුහුණ දීලා ජනතාවගේ ජීවන අරගලය සම්බන්ධව චෝදනා හෝ යෝජනා වලට ලක් වෙන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු.නන්දා මාලනී මහත්මිය කියලා තිබෙනවා

"රට කරවන්න නම් මසුරන් ඇතිව කැටේ
වටිනා කියන දේ විකිණිය යුතුය රටේ
අමන දනන් කෑ ගැසුවත් හතර වටේ
ඒවා නොවික්කොත් අපි හැම මකර කටේ"

කියලා.ඕක තමයි දැන් අපිටත් වෙලා තිබෙන්නේ.1978 න් පසු මේ රටේ පාලකයින් ආර්ථිකය තුල දේශපාලන කණ්ඩායම්,දේශපාලන නායකයෝ ආර්ථික හා සමාජ පරිහානියක් සිදු කලා. මේ රටේ හැම පාලකයෙක්ම මේ රටේ භෞතික සංවර්ධනය කරලා තිබෙනවා.හැබැයි මේ රටේ ජනතාව සුබෝපභෝගී ජීවන රටාවක් ගත කලා.නමුත් මේ රටේ හැම අංශයක්ම අද අකර්මන්‍ය වී තිබෙනවා.ගෝඨාභය රාජපක්ෂ මහතා නිදහස් පක්ෂයේ අපි,ඒ වෙලාවේ හැමෝම තෝරගත්තේ හොඳ වැඩපිළිවෙලක් තිබෙන නායකයෙක් විදිහට තමයි එතුමා හැඳින්වුවේ.අපේ පක්ෂයේ නායකයින් වුනත් ඒ තීරණය ගන්න තල්ලු කලා.ඒ නිසා හැට නව ලක්ෂයක් ජනතාව මේ ජනාධිපතිවරයා වටා එකතු වුණා.මේ රටේ භික්ෂු සංවිධාන,වෘත්තිකයෝ,කලාකරුවෝ ඇතුලු හැම දෙනෙක්ම එකතු වෙලා තමයි මේ ජනාධිපතිවරයා පත් කලේ.මේ රටේ හොඳ වියත් මහක් එකතු කරගෙන හොඳ විදිහට මේ රට පාලනය කරනවා කීවා.මේ රටේ ඒක පුද්ගල ණය ප්‍රමාණය ලක්ෂ 05ක් වෙලා තිබුණා.අද ඒක ලක්ෂ 07ක් විතර වෙලා තිබෙනවා.මේ ආර්ථික අර්බුදය විසඳා ගන්නා ආකාරය එතුමා හරි අපූරුවට විග්‍රහ කලා.ඒකයි ජනතාව එතුමා මේ රටේ ජනාධිපතිවරයා වශයෙන් පත් කර ගත්තේ.හැබැයි එතුමා වරද ගත් තැන තමයි මේ රටේ පවුල් පාලනය.මේ රටේ උගතුන් විද්වතුන් ඉද්දී තමන්ගේ ටික එකතු කරගෙන කිසිම දෙයක් අහන්නේ නැතිව වැඩ කටයුතු කලා.බැසිල් රාජපක්ෂ මහතා කීවා තට්ටු දෙකේ සිනමා ශාලාවක් හදලා නිකම් ඔහේ තියනවා කියලා.ඒ වගේ ඩොලර් ගෙනත් මේ රටේ සංවර්ධනය කල ව්‍යාපෘති තිබෙනවා.නිර්මාණශීලී ජනතාවක් විදිහට පක්ෂ භේදයක් නැතිව මේ රටේ ජනතාව පාරට බැහැලා තිබෙනවා.ගරු සභාපතිතුමණි,මේ බහුතරය තිබෙන්නේ මීට වසර එක හමාරකට පමණ පෙර තිබුණ ජන වරමයි.ඒ ජන වරම අද නෑ. ඒ ජන වරම නැති නිසා තමයි අද පාර්ලිමේන්තුවේ ඇමතිවරුන්ට,මන්ත්‍රීවරුන්ට ගෙවල් ආරක්ෂා කර ගන්න වෙලා තිබෙන්නේ.අද මේ රට ආර්ථික දරිද්‍රතාවයේ අන්තෙටම ගිහින් තිබෙනවා.මේකට හැම කෙනෙක්ම වග කියන්න ඕන.රාජපක්ෂ රෙජීමය පමණක් නොවෙයි.මේ රටේ ආණ්ඩු කල,අමාත්‍යාංශ දැරූ,සැලසුම් හදපු හැම කෙනෙක්ම මේකට වග කියන්න ඕන.අපේ රටේ සම්පත් නැතිව නෙවෙයි.නාසා ආයතනයේ විද්‍යාඥයන් වැඩිපුරම ඉන්නේ ලංකාවේ අය.අපේ රටේ බුද්ධි ගණය මේ තරම් ඉද්දී මේ රටේ දේශපාලනය තුල සුදුස්සෝ අදාල තැන් වලට පත් කරලා නෑ.මේක ගොඩ දාන්න පුළුවන් රටක්.මේ රටේ කෘෂිකර්මාන්තයේ ඉඳන් ස්වාභාවික සම්පත් ආදී හැම දෙයක්ම තිබෙන රටක්.මේ හැම දේම දේශපාලඥයින් විනාශ කරලා තිබෙනවා.අද සියලු දේශපාලඥයින් එපා කියනවා ජනතාව.මේ රටේ තිබෙන ගැටළු වලට විසඳුම් සොයන වැඩපිළිවෙල ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරම්භ කලේ නැතිනම් මේක නැවත ගන්න බෑ.අපිට තමයි මේකේ අහන බැනුමක් අහන්න වෙලා තිබෙන්නේ.රටක් විදිහට දේශපාලනය ප්‍රතික්ෂේප කරන තැනට ඇවිත් තිබෙනවා.පසුගිය දින කිහිපයේ මේ ආණ්ඩුව පක්ෂ වලට ආරාධනා කලා.කවුරුත් මේකට සූදානම් නෑ.මේ රට හදන වැඩ පිළිවෙලක් තිබෙන බුද්ධිමත් වියතුන් එකතු කරගෙන මේ රජය තව අවුරුද්දක් දෙකක් මේ රට ඉදිරියට ගෙන ගියේ නැතිනම් ආපසු මේ රට සෝමාලියාවක් වෙන්නත් බැරි නෑ.ඒ නිසා මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙල හදා ගත්තේ නැතිනම් දෙවියන්ගේම පිහිටයි.මේ රටේ තනතුරුවලට සුදුසු පුද්ගලයෝ පත් කරලා තීන්දු තීරණ ගත්තොත් මේ රට ගොඩ දාන්න පුළුවන්.එහෙම නැතිනම් මේ රට ආපස්සට යන එක නවත්තන්න බෑ.අපි ජනතාව එක්ක ඉන්න බව ප්‍රකාශ කරනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

අද උද්ගත වී තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය සභාවට යෝජනාවක් ඉදිරිපත් කලා.අපි ප්‍රාදේශීය නායකයින් විදිහට මේ සම්බන්ධව අපිත් යම් කතිකාවතක් ඇති කර ගත යුතුව තිබෙනවා.ඒ නිසා ඔබතුමිය ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් බොහෝම සතුටින් තමයි අපිත් එක්කාසු වෙන්නේ.මහ පොළවේ පය ගහලා ඉන්න මිනිස්සු විදිහට අපි පිළිගන්නවා රටේ මහ ජනතාවට ලොකු පීඩනයක් තිබෙනවා.භාණ්ඩ මිල අහස උසට නැගලා.ආණ්ඩුව සම්බන්ධයෙන් අපි ප්‍රශස්ති ගී ගායනා කරන්නේ නෑ.අපි ඇත්ත ඇති සැටියෙන් කතා කරනවා.ඒක තමයි මේ වෙලාවේ කල යුත්තේ.පරිප්පු,වියළි

මිරිස්,ගෑස්,සිමෙන්ති මිල විශාල වශයෙන් වැඩි වී තිබෙනවා.ග්‍රාමීය ජනතාවට වඩා කොළඹ හා නාගරික ප්‍රදේශවල,මහල් නිවාස සංකීර්ණ වල ජීවත් වෙන අයට දර වලින් කවදාවත් ඒ රාජකාරිය කරන්න බෑ.ඒ අයට ගෑස් අත්‍යාවශයයි.ඉන්ධන නෑ.මේවා සම්බන්ධව ලොකු පීඩනයක් ජනතාවට තිබුණා.ඒ පීඩනය තමයි පසුගිය දිනවල දෙදරලා ගියේ.ඒ සිදු වුණ කාරණය බොහෝම හොඳයි.අපේ නායකයින්ගේ ඇස් ඇරුනා මේකෙන්.නායකයින්ගේ සිංහාසන රත් වුණා.පඬුවස්නුවර ආසනය තුලත් එවැනි උද්ඝෝෂණ මාලාවක් සිදු වුණා.මාධ්‍යය හරහා සිදු වූ කරදර අපි දැක්කා.ඒවාට අපි විරුද්ධයි.සාමකාමී උද්ඝෝෂණ කොතෙක් කලත් ප්‍රශ්නයක් නෑ.මහ ජනතාවට හිංසා පීඩා නොවන ආකාරයට සාමකාමීව උද්ඝෝෂණ මාලාව සිදු කිරීම සම්බන්ධව ඒ නායකයින්ට මගේ ප්‍රශංසාව පුද කරනවා.ගරු මන්ත්‍රීනී නිශාන්ති මහත්මියගේ කතාවේ දී එතුමිය ප්‍රකාශ කලා එක් පවුලක් වටා බලය කේන්ද්‍රගත වීම සම්බන්ධව.බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ සම්ප්‍රාප්තිය වැරදියි කීවා.නමුත් අනෙක් සියලුම නායකයෝ මහජන ඡන්දයෙන් පත් වූ නායකයෝ.මොනරාගලින් ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,හම්බන්තොටින් නාමල් රාජපක්ෂ මහතා,කුරුණෑගලින් මහින්ද රාජපක්ෂ මහතා ආවේ ඒ දිස්ත්‍රික්කවල ජනතාවගේ ඡන්දයෙන්.ඔබතුමන්ලා විපක්ෂයේ සිටින විට ඒ නායකයින්ගේ වැරදි දකිනවා ඇති.හැබැයි අපි හොඳ දේවල් අමතක කරන්න හොඳ නෑ.මහින්ද රාජපක්ෂ මහතා මුළු ජීවිතයම කැප කලේ දේශපාලනය වෙනුවෙන්.මේ නායකයෝ විශාල වැඩ කොටසක් කලා.ගාමිණී දිසානායක මහතා,ලලිත් ඇතුලත්මුදලි මහතා,ආර්.ප්‍රේමදාස මහතා,ජේ.ආර්.ජයවර්ධන මහතා,මහින්ද රාජපක්ෂ මහතා රටට වැඩක් කලා.ජේ.ආර්.ජයවර්ධන මහතා 1978 න් පසුව කල දේ ප්‍රතිපලයක් තමයි අද මේ මිනිස්සුන්ට විඳින්න වෙලා තියෙන්නේ.දේශීය ආර්ථිකයක් හදන්න සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය බොහෝම උත්සාහ කලා.මහජනතාව පීඩනයකට ලක් වුනා.හැබැයි හැදුවා.ඒ ප්‍රතිපත්තිය ජේ.ආර්.ජයවර්ධන මහතා ඉදිරියට ගෙන ගියා නම් අද මේ තත්ත්වය ඇති වෙන්නේ නෑ.විවෘත ආර්ථිකය හඳුන්වා දීලා රටේ ආර්ථිකය කඩන් වැටුනා.අද පිටරටින් බඩු ගේනකම් මිනිස්සු මුහුද දිහා බලන් ඉන්නවා.මේවා නායකයින් ගත් තීන්දු තීරණ.පාස්කු ප්‍රහාරය පිළිබඳව කතා කලා. පාස්කු ප්‍රහාරය සිදු වන අවස්ථාවේ මේ රට පාලනය කලේ අපිද?අග්‍රාමාත්‍යවරයා වශයෙන් එවකට කටයුතු කලේ රනිල් වික්‍රමසිංහ මහතා.අනූ අට වතාවක් ඉන්දියාවේ බුද්ධි අංශ ලංකාවේ අදාල අංශ දැනුවත් කලා.බෝම්බ ප්‍රහාර එල්ල කරන දිනය,වේලාව,ස්ථානය,පුද්ගලයින් හා ඔවුන්ගේ නාම ලේඛනයක් පැහැදිලිව ප්‍රකාශ කලා.බෝම්බ ප්‍රහාර එල්ල කල දවසේත් බෝම්බ ප්‍රහාර එල්ල කරන්න කලිනුත් දැනුවත් කලා.නතර කලාද?එහෙම කරලා දැන් විපක්ෂයේ සිටි අයට ඇඟිල්ල දික් කරනවා.ආණ්ඩුවක් ඉන්නේ ඒවා අල්ලන්නනේ.ඒ සිද්ධිය වෙලා අවුරුදු දෙකක් දෙක හමාරක් යනකම් මොකක්ද කලේ.දැන් මේ සම්බන්ධව විමර්ශන කටයුතු කරනවානේ.මහ බැංකුව කැඩුවේ අපිද?මේ රටේ හැම තැනම චීන කොඩි කීවා. මහින්ද රාජපක්ෂ මහතා හැදුවේ හම්බන්තොට වරාය.ඒක විකුණුවේ අපිද?මොන ආණුඩුවේත් අඩුපාඩු තිබෙනවා.අපේ ආණ්ඩුවේත් අඩුපාඩු තිබෙනවා.ඒවා අපි පිළිගන්නවා.මහ ජනතාවගේ පීඩා නිමාවට පත් කරමින් ආණ්ඩුව හොඳ ගමනක් යයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා - (එ.ජා.ප.)</u>

ගරු උප සභාපතිතුමා කතා කලා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන්.ඒ සම්බන්ධයෙන් මම කතා කරන්නේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ එකම කතෝලික මන්ත්‍රීවරයා වශයෙනුයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇවිත් අවුරුදු දෙකක් උනා.පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මේ වන තුරු කිසිම දෙයක් කලේ නෑ.අපේ කාදිනල් හිමිපාණන් වහන්සේවත් මුලාවේ දැම්මා.කිසි කෙනෙකුට යුක්තිය ඉෂ්ට කලේ නෑ.කාදිනල් හිමිපාණන් වහන්සේ 2021.10.21 දින පවසනවා මේ සම්බන්ධව මේ වන තුරු නීතිය ඉටු වුණේ නෑ,අපි මේක දෙවියන් වහන්සේට භාර කරනවා කියලා. දෙවියන් වහන්සේට භාර කල දේ සත්‍යය අපිට පේනවා.මේ අපි ගත කරන්නේ කතෝලික අයගේ පාස්කු සමයයි.2022.04.21 වන විට පාස්කු ප්‍රහාරයට අවුරුදු තුනක්.දිට්ඨධම්මවේදනීය කර්මය මේ සිදු වෙන්නේ.මිනිස්සු ගහලා පන්නන තත්ත්වයට පත් වුනා.මේ අහිංසකයින්ගේ ලේ මතින් බලයට ඇවිත් ඒ සාපේ තමයි වැදුණේ.අද රාජපක්ෂ රෙජිමය එළවන්න මිනිස්සු කටයුතු කරනවා.ඔබතුමන්ලාට දේව සාප වැදුණේ.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ජනතාව කියන්නේ මේ 225 ටම එළියට යන්න කියලා.රාජපක්ෂ රෙජිමයට ඔබතුමන්ලා චෝදනා කලාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ගරු සභාපතිතුමා අවස්ථාව දුන්නා මේක පුළුවන් කෙනෙක් භාර ගන්න කියලා.හැබැයි රටේ ජනතාව බලාපොරොත්තු වුණේ වෙන දෙයක්.මේ ආණ්ඩුව ඉවත් කරලා සර්වපාක්ෂික සමුළුව කැඳවලා ආණ්ඩුවක් හදන්න ගරු ජනාධිපතිතුමා ආරාධනා කලා.කවුරුත් භාර ගන්නේ නෑ.ජනතාවට අවශ්‍ය පොහොර,තෙල්,ගෑස් ඇතුලු භාණ්ඩ ලබා ගන්නයි.මේකේ වැරදුණු තැනක් තිබෙනවා.ඒකට අපි වග කියන්න අවශ්‍ය නෑ.ඒ වැරදුණු තැන 1977.ඒ කාලේ දේශීය නිෂ්පාදන වලට

තැනක් තිබුණා.ආනයන සීමා කලා.මිල පාලනය තිබුණා.විදේශ විනිමය පිටරට ගියේ නෑ.මේ රටට නොගැලපෙන විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමේ විපාක විඳින්නේ වර්තමානයේ ඉන්න අපි.
වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුද තත්ත්වය පඹුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව වත්මන් කාලය තුල රට තුල ඇති වී තිබෙන අර්බුද තත්ත්වය පඹුවස්නුවර ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**06.කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**I.2022.03.10 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.03.10 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>

2022.03.10 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>

2022.03.10 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.03.10 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.03.10 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**II.2022.03.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.03.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>

2022.03.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022.03.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.03.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.03.24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

### I. 2022 මාර්තු මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 01

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2311487.33 | 1503620.43 | 1406875.56 | 42440.00 | 137504.93 | 2437514.99 | 7839443.24 |
| 2 | ගමන් වියදම් | 39920.00 | 0.00 | 5600.00 | 0.00 | 0.00 | 0.00 | 45520.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 476582.04 | 770951.50 | 300541.00 | 58087.00 | 0.00 | 25115.00 | 1631276.54 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 49584.29 | 30430.00 | 275404.40 | 6500.00 | 12500.00 | 0.00 | 374418.69 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 112441.71 | 129551.56 | 7980.00 | 64808.15 | 35588.89 | 9746.50 | 360116.81 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 2698.27 | 0.00 | 86.46 | 0.00 | 2784.73 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 3500.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 311000.00 | 314500.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 55196.37 | 0.00 | 0.00 | 0.00 | 16628.55 | 71824.92 |
| | පුනරාවර්ථන වැය එකතුව | **2993515.37** | **2489749.86** | **1999099.23** | **171835.15** | **185680.28** | **2800005.04** | **10639884.93** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 26950.00 | 4720.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 31670.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 10738.48 | 0.00 | 357.35 | 0.00 | 11095.83 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **26950.00** | **4720.00** | **10738.48** | **0.00** | **357.35** | **0.00** | **42765.83** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතුව** | **3020465.37** | **2494469.86** | **2009837.71** | **171835.15** | **186037.63** | **2800005.04** | **10682650.76** |
| | තැන්පත් | 637873.90 | | | | | | 637873.90 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 1016621.00 | | | | | | 1016621.00 |
| | අත්තිකාරම් | 34595.00 | | | | | | 34595.00 |
| | ණයහිමි | 2492228.47 | | | | | | 2492228.47 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **4181318.37** | | | | | | **14863969.13** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 මාර්තු මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2022 මාර්තු මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය)

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.**

උපලේඛන 02

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 14344.00 | 104000.00 | - | - | - | 118080.00 | 236424.00 |
| 20 කුලී | - | - | 728701.77 | - | 1759326.00 | 16000.00 | 2504027.77 |
| 30 බලපත්‍ර ගාස්තු | 0.00 | 108250.00 | - | - | - | 9600.00 | 117850.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 0.00 | 487445.00 | 271010.50 | 55575.50 | - | 5525.00 | 819556.00 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 32850.00 | 0.00 | 2162.00 | 0.00 | 35012.00 |
| 60 වෙනත් ආදායම් | 137735.12 | 146925.00 | 159846.00 | 429041.00 | 0.00 | 1445.00 | 874992.12 |
| 70වෙනත් ආධාර | 4058300.00 | 1195200.00 | 2944101.60 | 84880.00 | 274920.00 | 6319086.15 | 14876487.75 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **4210379.12** | **2041820.00** | **4136509.87** | **569496.50** | **2036408.00** | **6469736.15** | **19464349.64** |
| ප්‍රාග්ධන ආධාර | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **4210379.12** | **2041820.00** | **4136509.87** | **569496.50** | **2036408.00** | **6469736.15** | **19464349.64** |
| තැන්පත් | 626204.24 | | | | | | 626204.24 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 41615.50 | | | | | | 41615.50 |
| සේවක ණය | 516317.56 | | | | | | 516317.56 |
| අත්තිකාරම් | 7000.00 | | | | | | 7000.00 |
| ණය ගැති | 104027.00 | | | | | | 104027.00 |
| සමු: අරමුදල | 5000.00 | | | | | | 5000.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 0.00 | | | | | | 0.00 |
| **මුළු එකතුව** | **1300164.30** | | | | | | **20764513.94** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 මාර්තු මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III.2022 මාර්තු මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව)

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 03

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය<br>1 | මාසය මුලදී ඉදිරියට ලැබීම්<br>2 | මාසය තුළ බිල් කිරීම්<br>3 | ලැබිය යුතු මුළු ආදායම<br>4<br>(1+3) | මාසය තුළ ලද ආදායම<br>5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම<br>6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම<br>7<br>( 2-6) | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම<br>8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය<br>9 | ඉදිරියට ගෙන යන හිඟය<br>10<br>4 - (5+6) | ඉදිරියට ලැබීම්<br>11<br>(7+8) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් බදු 1/11 | 44379.67 | 100440.29 | 426643.17 | 471022.84 | 1023879.59 | 72824.17 | 27616.12 | 881347.62 | 26681.86 | 153449.77 | 908963.74 |
| 2 | අක්කර බදු 1/12 | 17515.50 | 4612.66 | 7527.50 | 25043.00 | 1878.00 | 3622.66 | 990.00 | 3965.00 | 0.00 | 23507.34 | 4955.00 |
| 3 | කඩ කුලී 3/22 | 333696.77 | 60217.34 | 724850.00 | 1058546.77 | 717701.77 | 48367.34 | 11850.00 | 35072.34 | 0.00 | 327550.00 | 46922.34 |
| 4 | වත්කම් බදු 5/23 | 1762599.82 | 43907.00 | 1152743.00 | 2915342.82 | 1090736.00 | 18547.00 | 25360.00 | 0.00 | 0.00 | 1806059.82 | 25360.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 1047570.98 | 60014.21 | 489831.00 | 1537401.98 | 404036.00 | 19543.28 | 40470.93 | 18448.64 | 104027.00 | 1028244.34 | 58919.57 |
| 6 | ව්‍යාපාර බදු 2/16 | 0.00 | 0.00 | 96000.00 | 96000.00 | 96000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/14 | 0.00 | 0.00 | 3000.00 | 3000.00 | 3000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 108250.00 | 108250.00 | 108250.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | විශේෂ බලපත්‍ර ගාස්තු2/34 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | එකතුව | 3205762.74 | 269191.50 | 3008844.67 | 6214607.41 | 3445481.36 | 162904.45 | 106287.05 | 938833.60 | 130708.86 | 3338811.27 | 1045120.65 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 මාර්තු මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV.2022 මැයි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 04

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | | | මාසික ආදායම් පුරෝකථන | | | අය වී ඇති ආදායම 2022 මාර්තු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9(7+8) |
| වරිපනම් ( 1/11) | 1785000 | 0 | 1785000 | 598000 | 153000 | 751000 | 983488.98 | 13708 | 997196.98 |
| අක්කර බදු ( 1/12 ) | 50000 | 0 | 50000 | 19000 | 5000 | 24000 | 1242 | 636 | 1878 |
| කසල බදු(2/13) | 1000 | 0 | 1000 | 300 | 100 | 400 | 0 | 0 | 0 |
| කර්මාන්ත බදු(2/16/i) | 50000 | 0 | 50000 | 50000 | 0 | 50000 | 12500 | 3000 | 15500 |
| ඇතැම් ව්‍යාපාර බදු(2/16/iii) | 1000 | 0 | 1000 | 1000 | 0 | 1000 | 0 | 0 | 0 |
| ව්‍යාපාර බදු ( 2/16/ii ) | 2000000 | 0 | 2000000 | 2000000 | 0 | 2000000 | 821400 | 96000 | 917400 |
| බලපත්‍ර ගාස්තු ( 2/31/i ) | 1400000 | 0 | 1400000 | 1364000 | 5000 | 1369000 | 416883.15 | 108250 | 525133.15 |
| විශේෂ බල:ගාස්තු(2/31/ii) | 125000 | 0 | 125000 | 0 | 60000 | 60000 | 0 | 0 | 0 |
| කඩ කුලී ( 3/22 ) | 8350800 | 0 | 8350800 | 2783600 | 695900 | 3479500 | 1423523.04 | 717701.77 | 2141224.81 |
| ජංගම අලෙවි කුටි( 3/22-i) | 297000 | 0 | 297000 | 297000 | 0 | 297000 | 262200 | 0 | 262200 |
| රථගාල් ගාස්තු(3/43/3) | 300000 | 0 | 300000 | 115000 | 30000 | 145000 | 25200 | 27600 | 52800 |
| ජල ගාස්තු(4/62,64) | 5800000 | 0 | 5800000 | 1932000 | 483000 | 2415000 | 631007.65 | 508063 | 1139070.65 |
| සතිපොල බදු ( 5/22 ) | 8470000 | 0 | 8470000 | 3244000 | 510000 | 3754000 | 1344950 | 668590 | 2013540 |
| බදු කුලී ( 5/23 ) | 8214535 | 0 | 8214535 | 2464365 | 821455 | 3285820 | 7159163.2 | 1090736 | 8249899.2 |
| විනෝද බදු ( 6/15 ) | 400000 | 0 | 400000 | 120000 | 37500 | 157500 | 119625 | 118080 | 237705 |
| ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/2) | 160000 | 0 | 160000 | 45500 | 11000 | 56500 | 0 | 0 | 0 |
| එකතුව | 38889943 | 0 | 38889943 | 15033765 | 2811955 | 17845720 | 13201183 | 31046903.02 | 44248086.04 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මැයි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 මැයි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 මැයි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මැයි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 මැයි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V.2022 අප්‍රේල් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව
## උපලේඛන 05 සඳහා අනිත් පිට බලන්න.

# උපලේඛන 05

| අනුඅංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 93270132.00 | | 93270132.00 | 23317533.00 | 7772511.00 | 31090044.00 | 21897229.22 | 7839443.00 | 29736672.22 | 1353371.78 |
| 2 | ගමන් වියදම් | 1064000.00 | | 1064000.00 | 230000.00 | 80000.00 | 310000.00 | 152540.00 | 45520.00 | 198060.00 | 111940.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 12263000.00 | | 12263000.00 | 2163000.00 | 925000.00 | 3088000.00 | 1510769.82 | 1631276.54 | 3142046.36 | -54046.36 |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 14040000.00 | | 14040000.00 | 5600000.00 | 2000000.00 | 7600000.00 | 2009846.00 | 374418.69 | 2384264.69 | 5215735.31 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11474000.00 | | 11474000.00 | 3000000.00 | 1000000.00 | 4000000.00 | 708273.00 | 360117.00 | 1068390.00 | 2931610.00 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 167360.00 | | 167360.00 | 19784.73 | 2617.67 | 22402.40 | 13368.00 | 2784.73 | 16152.73 | 6249.67 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 6138000.00 | | 6138000.00 | 930000.00 | 450000.00 | 1380000.00 | 455000.00 | 314500.00 | 769500.00 | 610500.00 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 968040.00 | | 968040.00 | 248000.00 | 60000.00 | 308000.00 | 192236.00 | 71825.00 | 264061.00 | 43939.00 |
| 9 | උපකරණ වැය | 34425000.00 | | 34425000.00 | 9500000.00 | 3500000.00 | 13000000.00 | 2250000.00 | 31670.00 | 2281670.00 | 10718330.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 2196000.00 | | 2196000.00 | 74595.83 | 11263.00 | 85858.83 | 51013.00 | 11096.00 | 62109.00 | 23749.83 |
| | එකතුව | 176005532.00 | | 176005532.00 | 45082913.56 | 15801391.67 | 60884305.23 | 29240275.04 | 10682650.96 | 39922926.00 | 20961379.23 |

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**
2022 අප්‍රේල් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)**
2022 අප්‍රේල් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**
2022 අප්‍රේල් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**
2022 අප්‍රේල් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2022 අප්‍රේල් මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් ,2022 වර්ෂයේ අප්‍රේල් මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ප.ව.2.00 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කලේ :පී.ඒ.ඩී.එස්.දිසානායක,කළමනාකරණ සේවා නිලධාරී.

වාර්තා කලේ :එච්.ඒ.ජී.නිශ්ශංක,ලේකම්,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව